**බස්නාහිර පළාතේ ළමා රැකවරණ සංවර්ධන මධ්‍යස්ථානවල ළමුන් හා ළමා මවුවරුන්ගේ යහපත සඳහා කටයුතු කරන අදාල රාජ්‍ය ආයතනවල කාර්යයන් සම්බන්ධ කාර්ය සාධන විගණන වාර්තාව. - 2011**



**කාර්ය සාධන හා පරිසර විගණන ඒකකය**

**විගණන වාර්තා අංක : වයිඑස් / පීජී / සීසීඩීසීඑස් / 2011 / 01**

# 2014 - මැයි

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**

## 1. විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ ළමුන්ගේ අභිවෘද්ධිය හා ළමා අයිතිවාසිකම් ආරක්ෂාව ඉටු කරන ප්‍රධාන ආයතනය ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයයි. එම අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතන කීපයක් ආයතනගත වන ළමුන්ගේ හා පොදුවේ ළමා පරපුරේ අභිවෘද්ධිය වෙනුවෙන් අරමුණ ඉටු කිරීම පිණිස ස්ථාපිත වී ඇත. මෙම විගණනයේ අරමුණු වූයේ අනාථ වූ , අසරණ වූ , හුදකලා වූ ළමුන්ගේ සුභසාධනය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන වල කටයුතු වල කාර්යසාධනය පිළිබඳව පරීක්ෂා කිරීම මෙන්ම එම ළමුන්ට අවශ්‍ය පහසුකම් සැපයීමේ දී සහ ඔවුන් රටේ යහපත් පුරවැසියන් බවට පත්කිරිමේ දී අදාල ආයතන විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් වල සාර්ථකත්වය තහවුරු කර ගැනීම වේ.

කාර්ය මණ්ඩලය, වෙනත් සම්පත් හා විගණනයට වෙන්කරන ලද කාලය සීමාවීම හේතුවෙන් අපගේ කාර්ය සාධන විගණනයේ විෂය පථය බස්නාහිර පළාතේ පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආයතනවලට පමණක් සීමා කරන ලදී. නියැදි පදනමින් පරික්ෂාවට ලක්කරන ලද ආයතන කීපයක් සම්බන්ධව නිරීක්ෂණය වූ කරුණු අනුව රජයේ සහ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ළමුන්ගේ සෞඛ්‍ය තත්ත්වයන් ප්‍රවර්ධනය සඳහා ගන්නා ලද සුභ සාධන ක්‍රියාමාර්ග සතුටුදායක වන අතර අවස්ථා කිහිපයක දී හැර ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සමබර ආහාර වේල්, වෛද්‍ය පහසුකම්, සායන සේවා සැපයීම හා ළදරුවන් එන්නත් කිරීම් ද සතුටුදායක විය.

උසාවි නියෝග මගින් පරිවාස ගතකරන ලද ළමුන්ගේ අධ්‍යාපනයට අදාල කටයුතු සහතික කරන ලද පාසල් දෙකක් මගින් සපයනු ලැබේ. කෙසේ වුව ද ළමා සංවර්ධන මධ්‍යස්ථාන මගින් සපයනු ලබන අධ්‍යාපන පහසුකම් හා ළමුන්ගේ සහභාගීත්වය සතුටුදායක මට්ටමක නොවූ අතර වෘත්තීය අධ්‍යාපනය කටයුතු ද අපේක්ෂිත මට්ටමට නොවීය.

රැකවරණය හා ආරක්ෂාව අවශ්‍ය බොහෝ අසරණ ළමුන් සුදුසු ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට යොමුකිරීම වෙනුවට රැඳවුම් නිවාසවලට යොමුකර තිබුණි. පරිවාස නිලධාරින් විසින් එම ආයතන වෙත පැමිණ ඒවායේ කටයුතු පිළිබඳ විධිමත් අධීක්ෂණයක් සිදු කළ යුතු වුවද එම අධීක්ෂණය සතුටුදායක නොවීය. ඒ හැරුණුවිට ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් නිසි වැඩපිළිවෙලක් නොමැතිවීම, අවශ්‍ය කාර්ය මණ්ඩලය නොමැති වීම, කාර්ය මණ්ඩලය අභිප්‍රේරණ කටයුතු සතුටුදායක නොවීම යන කරුණු හේතුවෙන් ළමුන් වෙනුවෙන් ඵලදායී වැඩකොටස් ඉටු කිරීමට අවශ්‍ය වාතාවරණය සැලසී නොතිබුණි.

මෙම නිවාස ගතවන ළමුන් දරුකමට හදාවඩා ගැනීමට දෙමාපියන් ඉදිරිපත්වීම ඉහල මට්ටමක පැවතියද අදාල ක්‍රියාවලියේ සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් ළදරුවන් බොහෝ සංඛ්‍යාවක් දීර්ඝ කාලයක් නිවාසවල රදවා තබා ගැනීමට සිදුවී තිබුණි.

අවාසනාවන්ත ලෙස මෙසේ විවිධ ගැටළුවලට මුහුණ දෙන ළමුන්ගේ අනාගතය සුභදායී කිරීම වෙනුවෙන් අධ්‍යාපන පහසුකම්, සෞඛ්‍ය පහසුකම් හා ඔවුන්ට වෘත්තීය පුහුණු ලබාදීම මෙන්ම වඩා හොද හා ඵලදායී සමාජගත කිරිමේ වැඩසටහන් ලබාදීම අරමුණු කරගෙන මෙම ආයතනවල භෞතික සම්පත් නිසි පරිදි නඩත්තු කිරීම මගින් මෙම ස්ථාන ළමුන්ට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට කටයුතුකර ළමුන් සමාජගත කිරීමේ මෙම වැඩ පිළිවෙල ඵලදායී හා කාර්යක්ෂම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මගින් රටේ අනාගත පරපුරේ එක් කොටස්කරුවෙකු වශයෙන් මෙම ළමුන්ගේ අනාගතය සෞභාග්‍යමත් කිරීමට කටයුතු කළ හැක.

## 1. හැදින්වීම

### 2.1 ආයතන ව්‍යුහය

ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය 2005 වර්ෂය අවසානයේ ස්ථාපිත කරන ලද අතර පසුව 2010 අමාත්‍ය මණ්ඩල සංශෝධනයේදී එය ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය ලෙස වෙනස් කරන ලදී. අමාත්‍යාංශයේ ප්‍රධාන විෂය පථය ළමා සංවර්ධන හා කාන්තා සංවර්ධනය ලෙස ප්‍රධාන අංශ දෙකකට වර්ග කර තිබුණි. ළමා සංවර්ධනය සඳහා ජාතික ළමාරක්ෂක අධිකාරිය , ළමා ලේකම් කාර්යාලය හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යන ආයතන වගකීම දරයි. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වැනි ආයතන මගින් කාන්තා හා ළමා අයිතීන් සුරක්ෂිත කර ගැනීම, හැකියාවන් වර්ධනය හා යටිතල පහසුකම් සඳහා පළාත් මාර්ගයෙන් වැඩ සටහන් ගණනාවක් හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදී ඇත.

### 2.2 පසුබිම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව දීප ව්‍යාපාත්ත පරිවාස හා ළමාරක්ෂක සේවා සැපයීමේ රජයේ ආයතනය වේ. එය අනාථ වූ , අත්හැර දැමූ , අසරණ හා අපයෝජිත ළමුන් සහ බාලක වරදකරුවන් පරිවාස නිලධාරින්ගේ නිර්දේශය මත රජයේ හා ස්වේච්ඡා මධ්‍යස්ථානවලට ඇතුළත් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලවල් සකස් කර ඇත. 2009 සංඛ්‍යා ලේඛන වාර්තාව අනුව, ළමා නිවාස 354 ක් සඳහා ළමුන් 14, 842 ක් ඇතුළත් කර තිබුණි. රජයේ නිවාස 27 ක් සඳහා රජය පහසුකම් සපයනු ලබන අතර, ඉතිරි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 327 රජයේ පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පවතී.

පරිවාස හා ළමාරක්ෂ සේවා දෙපාර්තමේන්තුවේ අරමුණු පහත පරිදි විය.

- බාලවයස්කරුවන්, තරුණයින් හා වැඩිහිටි වරදකරුවන් පුනරුත්ථාපන ක්‍රියාවලිය මගින් සමාජගත කිරීම.
- අනාථ වූ, අත්හැර දැමූ හා අසරණ වූ ළමුන්ගේ අයිතීන් සුරක්ෂිත කර ගැනීමට ක්‍රියා කිරිම.
- නීතිමය කරුණුවලට යටත් වූ ළමුන්ගේ අයිතීන් සුරක්ෂිතකර ගැනීම.
- ළමුන්ගේ අයිතීන් ප්‍රවර්ධනය කර ගැනීම සඳහා පියවර ගැනීම.

## 2.3 ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි විය.

(අ) පරිවාස කටයුතු

(ආ) ළමාරක්ෂක කටයුතු

පරිවාස කාර්යයන් යටතේ, උසාවි මගින් වරදකරුවන් ලෙස තීරණය කරනු ලබන ළමුන් පුනරුත්ථාපනය කෙරෙන අතර ළමාරක්ෂක කාර්යයන් යටතේ, ළමා ප්‍රඥප්තියට අනුව ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්‍ෂා වී තිබේ ද යන්න සහතිකකර ගැනීම සඳහා විශේෂ වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලැබේ.

වරදකරුවන් පුනරුත්ථාපනය කිරීමේ අදහසින් පර්යේෂණාත්මක ක්‍රමවේදයන් ලෙස 1930 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ අධිකරණ අංශයට පරිවාස ක්‍රමය හඳුන්වාදෙන ලදී. මෙම ක්‍රමය 1944 අංක 22 දරන පරිවාස ආඥාපනත මගින් ස්ථාපිත කරන ලදී.

ළමා හා තරුණ ආඥාපනත ක්‍රියාත්මක කිරීමත් සමග 1944 වර්ෂයේදී ස්ථාපිත කරන ලද අධිකරණ කලාප හා ළමා උසාවි ආවරණය කිරීම සඳහා පැවතුණු පරිවාස සේවා ක්‍රමය ව්‍යාප්ත කරන ලදී. මෙම විෂයෙහි මූලික ආයතන ලෙස 1956 දී පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.

1987 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 13 වෙනි සංශෝධනය පැනවීම මගින් ඇති කළ පළාත් සභාවල කාර්යන් යටතේ පරිවාස සේවය ඇතුලත් කරන ලදී. මේ යටතේ පළාත් පරිවාස හා ළමාරක්‍ෂක කොමසාරිස්වරු පත්කරන ලදී. මේ අනුව අධිකරණ කලාප මට්ටමින් පළාත් දෙපාර්තමේන්තු 09 ක් පිහිටුවා ඇති අතර පරිවාස කාර්යාල 60 ක් ස්ථාපිත කර ඇත.

බස්නාහිර පළාතේ පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවට රජයට අයත් ළමා නිවාස 05 ක් හා ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 93 ක් අයත් වේ. ගැහැණු ළමුන්ට හා පිරිමි ළමුන්ට වශයෙන් පිළිවෙලින් රන්මුතුගල හා මාකොළ රැඳවුම් නිවාස දෙකක් හා සහතික කළ පාසල් දෙකක් පිහිටුවා ඇති අතර පානදුර ප්‍රජාපතී නිවාසය ළමුන් භාරගැනීමේ නිවාසයක් ලෙස කටයුතු කරයි.2009 වර්ෂයේදී රජයට අයත් නිවාසවලට හා ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට ඇතුළත් කරන ලද ළමුන් සංඛ්‍යාව පිළිවෙලින් 249 ක් හා

3, 689 ක් විය. බස්නාහිර පළාතේ ලියාපදිංචි නොකරන ලද නිවාස 27 ක් වීමද මෙහිදී කැපී පෙනෙයි.

## 2.4 විගණනය සඳහා අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 2.5 විගණනයේ අවශ්‍යතාවය හා මාතෘකාව තෝරාගැනීමට හේතුව

ළමා අපයෝජනයන් හා ළමුන් අත්හැරදැමීම, ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් පැනනැගී ඇති ප්‍රධාන ජාතික ප්‍රශ්නයක් බවට පත් වී ඇත. පොදු මහජනයා අතර කම්පනයට හා තැතිගැන්මට හේතුවන නිතර නිතර සිදුවන ළමා අපයෝජන අවස්ථාවන් පිළිබඳ මුද්‍රිත මාධ්‍යයෙන් හා විද්‍යුත් මාධයෙන් වාර්තා කරනු ලැබේ. සමාජය තුළදී ළමුන්ට හොඳින් රැකවරණය හා ආරක්ෂාව නොලැබෙන අවස්ථා දැකිය හැකි අතර එම තත්ත්වය හේතුවෙන් එම ළමුන් බාලක වරදකරුවන් හා අනාරක්ෂිත බවට පත්වීමට ඉඩකඩ ඇත. එවැනි ළමුන් සඳහා රැකවරණය දීමට හා අවාසනාවන්ත තත්ත්වයන්ගෙන් ආරක්‍ෂාකර ගැනීමට හා අනාගතයේ දී යහපත් පුරවැසියන් බවට පත්කිරීමට රජය විසින් පියවරයන් කීපයක් ගෙන ඇත.

## 2.6 විගණනයේ අරමුණ

මෙම විගණනයේ අරමුණු වූයේ අනාථ වූ , අසරණ වූ , හුදකලා වූ ළමුන්ගේ සුභසාධනය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන වල කටයුතු වල කාර්යසාධනය පිළිබඳව පරීක්‍ෂා කිරීම මෙන්ම එම ළමුන්ට අවශ්‍ය පහසුකම් සැපයීමේ දී සහ ඔවුන් රටේ යහපත් පුරවැසියන් බවට පත්කිරිමේ දී අදාල ආයතන විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් වල සාර්ථකත්වය තහවුරු කර ගැනීම වේ.

## 2.7 විගණන විෂය පථය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ කාර්ය සාධන විගණනය සිදු කරන ලද අතර, අපට අවශ්‍යයැයි සැලකෙන පරීක්ෂණයන්ද ඊට ඇතුලත් විය. පරිවාස හා ළමාරක්ෂක

සේවා දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් හා අභ්‍යන්තර පාලන පද්ධති, ( ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට වන බලපෑම නිශ්චය කර ගැනීමේ පදනමක් ලෙස යොදා ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට ) හඳුනා ගන්නා ලද අරමුණු සාක්ෂාත් කර ගැනීම හා සම්බන්ධ අවදානම් පිළිබඳ අවබෝධයක් අප විසින් ලබා ගත් අතර, අපගේ කාර්ය සාධන විගණනයේ සොයා ගැනීම් හා නිර්දේශයන් පිළිබඳ නිගමන වලට එළඹෙන ලදී.

එහිදී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකරන ලදී.

**(අ)** අප විසින් ප්‍රමාණාත්මක යැයි සලකනු ලැබූ සහ ඒ පිළිබඳ සාධාරණ නිගමනයන් ඇතිකර ගැනීමට අපට හැකිවන පරිදි අදාල විගණන සාක්ෂි ලබාගැනීම අප විසින් අපේක්ෂා කරන ලදී. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව අරමුණු ඉටුකරගැනීමේ දී අවදානම වැළැක්වීම හා සම්බන්ධිත කටයුතු පිළිබඳ අපගේ තක්සේරුවට අනුව අපගේ පටිපාටිවල ස්වභාවය හා ප්‍රමාණය වෙනස් වුණි. අපගේ පටිපාටි වලට සොයාගැනීම් හා නිර්දේශයන්ට උපකාර වන සාක්ෂි පරීක්ෂා කිරීම් ද ඇතුළත් විය.

**(ආ)** අපගේ විෂය පථය බස්නාහිර පළාතට පමණක් සීමා වු අතර මෙම කාර්යය පළමුව සැලසුම් කර විගණන සැලැස්මකට සම්බන්ධ කරන ලදී. කාර්ය සාධන විගණනයේදී අපගේ සොයාගැනීම් පදනම් කරගෙන මෙය වෙනස්විය. ඒ අනුව , අපගේ විගණන විෂය පථය විශේෂ අවස්ථා මත වෙනස් වී ඇත.

**(ඇ)** බස්නාහිර පළාතේ 2010 වර්ෂයේදී සහතික පාසල් 02 ක්, රැදවුම් නිවාස 02 ක් ළමුන් භාරගැනීමේ නිවාස 01 ක් සහ ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 93 ක් සහ ලියාපදිංචි නොකළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 27 ක් පැවතුණි. බස්නාහිර පළාතේ සහතික පාසැල් 02 ක්, රැදවුම් නිවාස 02 ක්, ළමුන් භාරගැනීමේ නිවාස 01 ක් හා ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන 11 ක් හා ලියාපදිංචි නොකළ 01 ක් අපගේ කාර්ය සාධන විගණනය මගින් ආවරණය කරන ලදී.

## 2.8 සීමා කිරීම්, විරල බැහැරවීම් සහ ප්‍රතිකර්ම.

කාර්ය සාධන විගණනයේ ප්‍රමාණය, කාලය හා කාර්යය සඳහා ලබා ගත හැකි මානව සම්පත් මත පදනම් වූ නියැදි පටිපාටියකට සීමා විය. අප විසින් සම්මුඛ සාකච්ඡා වලට බඳුන් කරන ලද ළමුන් ගෙන් නිවැරදි තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවයක් පැවතිණි.

## 2. විගණන නිරීක්ෂණ, නිර්දේශ සහ නියෝජිතායතන ප්‍රතිචාර.

### 3.1 සෞඛ්‍ය පහසුකම්.

පරිවාස ගත වන ළමුන් වෙනුවෙන් සැපයෙන සෞඛ්‍ය පහසුකම් සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නුගේගොඩ ප්‍රදේශයේ පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක සිටි වයස අවුරුදු 0 - 15 අතර වයස් කාණ්ඩයෙහි වූ ළමුන් 15 දෙනෙකු අතරින් 6 දෙනෙකු අනතුරුදායක රෝග වලට එරෙහිව ආරක්ෂාව සඳහා නියමිත කාලයට එන්නත් කොට නොමැති බව අප විසින් සොයා ගන්නා ලදී. එසේම එම ළමා නිවාසයෙහි සිටි ළමුන් 8 දෙනෙකුගේ උස සහ බර ප්‍රදේශය භාර පවුල් සෞඛ්‍ය සේවිකාවන් විසින් නිතිපතා මසකට වරක් පරික්ෂා කර නොතිබුණි.

(ආ) රජයේ එන්නත් කිරීමේ ප්‍රතිපත්තිය අනුව ළමුන් රුබෙල්ලා සඳහා එන්නත් කළ යුතු වේ. එසේ වූවත් ඉහතකී නුගේගොඩ පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙහි සිටි ළමුන් 93 දෙනෙකු සහ බොරැල්ල ප්‍රදේශයේ පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක සිටි ළමුන් 38 දෙනෙකු හට රුබෙල්ලා එන්නත් කළ බවට සාක්ෂි හමු නොවීය. එසේම නාරහේන්පිට ප්‍රදේශයේ පිහිටි ළමා නිවාසයක සිටි ළමුන් 48 දෙනෙකු අතරින් 19 දෙනෙකු සඳහා රුබෙල්ලා එන්නත් කොට ඇති බවට සාක්ෂි හමු නොවීය. තවද වයස අවුරුදු 10 ට වැඩි ළමුන් සඳහා වැඩිහිටි පිටගැස්ම සහ ඩිප්තීරියා වෙනුවෙන් එන්නත් කළ යුතු වූවත් බොරැල්ල ප්‍රදේශයේ පිහිටි ඉහතකී ළමා සංවර්ධන මධ්‍යස්ථානයක සිටි ළමුන් 38 දෙනෙකු අතරින් 35 දෙනෙකු සඳහා එම එන්නත ලබා දී ඇති බවට සාක්ෂි නොවීය.

(ඇ) ළමුන්ගේ පෞද්ගලික ලිපි ගොණුවල ඇතුලත් සටහන් ප්‍රකාරව රන්මුතුගල හා මාකොල සහතික කල පාසල් වල සහ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල වෙසෙන බොහෝ ළමුන් හට උපදේශන සේවා අවශ්‍ය බව පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

i. ආදරය සහ රැකවරණය මදකම.
ii. බොහෝ ළමුන් හට දෙමාපියන් හෝ සමීප ඥාතීන් නොමැති වීම.
iii. ළමුන් බැලීම සඳහා සමීප ඥාතීන් පැමිණීමෙ මදකම.
iv. දෙමාපියන්ගේ දුර්වල සමාජ මට්ටම. ( බොහෝ ළමුන්ගේ දෙමාපියන් ඔවුනොවුන්ගෙන් වෙන්වූ , මත් ද්‍රව්‍ය විකිණීම, සොරකම් හෝ මිනී මැරුම් වැනි වරදවල් සම්බන්ධයෙන් සිරගත වූ අය වේ. )

v. ඇතැම් ළමුන් හානිකර සේදුම් කාරකයන් පානය කර සියදිවි නසා ගැනීමට තැත් කිරීම හෝ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වෙතින් පළා යාමට උත්සාහ කර තිබීම.

vi. සහතික කළ පාසල් වල වෙසෙන සියලු ළමුන් ළමා වරදකරුවන් වීම. (සොරකම් කිරීම, පහර දීම්, ලිංගික හිංසනයන් සිදු කිරීම, ළමා සංවර්ධන මධ්‍යස්ථාන වෙතින් පළා යාම වැනි නීතිවිරෝධී ක්‍රියාවන් හී නිරත වීම.)

තත්ත්වය උග්‍ර අතට හැරී තිබුණ ද මුල් අදියරේ දී ළමුන් පුනරුජ්තාපනය කිරිමට අවශ්‍ය ඵලදායි උපදේශන සැපයිම සඳහා ස්ථිර උපදේශයෙකු පත් කර නොතිබුණි.

**(ඇ)** මාකොළ රැදවුම් නිවාසය, මාකොළ සහතික කළ පාසැල හා රන්මුතුගල රැදවුම් නිවාසයෙහි සිටින ඇතැම් ළමුන්, මානසික හා ශාරීරික දුබලතාවයන් හේතුවෙන් තම කටයුතු කළමනාකරණය කරගැනීමට නොහැකි වී තිබූ අතර ඔවුන්ට විශේෂ අවධානය යොමුකිරීම හා ප්‍රතිකාර ලබාදීමක් සිදු වී නොතිබුණි. උදාහරණ ලෙස මෙම මධ්‍යස්ථාන තුනෙහිම එක් අයෙකු බැගින් එසේ දුබලතාවයට පත්ව සිටි බව නිරීක්ෂණය විය.

**(ඉ)** රන්මුතුගල සහතික කළ පාසැලෙහි පිරිසිදුභාවය බෙහෙවින් නරක තත්ත්වයක වූ අතර 2011 ඔක්තෝබර් 25 විගණන දිනයේ දී වැසිකිළි වළවල් උතුරායාමෙන් පිළිකුල් සහගත ගන්ධයක් වහනය වෙමින් පැවතුණි. මෙය ළමුන්ගේ සෞඛ්‍යයට බලවත් තර්ජනයක් විය. මුළුතැන්ගෙයි තත්ත්වය ඉතා අයහපත් වූ අතර මෙය පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ක්‍රමවත් හා ඵලදායී අධීක්ෂණයක් සිදු නොකිරීමේ ප්‍රතිඵලයක් බව නිරීක්ෂණය විය.

**ඇඟවීම**

(i) ළමුන්ගේ මානසික හා ශාරීරික සෞඛ්‍ය තවදුරටත් පිරිහිමේ හැකියාව.

(ii) ළමුන් පුනරුත්ථාපනයෙන් පසුව මානසික හා ශාරීරික වශයෙන් සෞඛ්‍ය සම්පන්න පුද්ගලයන් ලෙස මුදා හැරීමට නොහැකියාව.

(iii) ක්‍රමික පරීක්ෂාකිරීම් නොමැතිවීම හේතුවෙන් ළදරුවන්ගේ නිසි වර්ධනය සම්බන්ධ වැදගත් තොරතුරු ලබා ගැනීමට නොහැකිවීම.

(iv) ළමා සංවර්ධන මධ්‍යස්ථාන සමග ඒකාබද්ධ වූ විධිමත් උපදේශක වැඩසටහන් නොපැවැත්වීමේ ප්‍රතිඵල ලෙස ළමුන් නිවාසවලින් පැනයාම්, ළමුන් අතර කලහකාරි හැසිරීම් හා ලිංගික අපචාර වලට ඇබ්බැහිවීම් ඇතිවීම.

(v) විවිධ රෝගවලට ගොදුරුවීමේ අවදානම.

(vi) අනාගතයේ දී ළමුන් සම්බන්ධයෙන් ඇතිවන සමාජමය ප්‍රශ්න තවදුරටත් සංකීර්ණ වීම.

**නිර්දේශ**

(i) නිසි වේලාවට එන්නත් ලබාදීමේ වැදගත්කම ළමා සංවර්ධන මධ්‍යස්ථානවල අදාළ බලධාරින්ව දැනුවත් කළ යුතුය.

(ii) හොඳ සෞඛ්‍ය පුරුදු වල වැදගත්කම ළමයින්ට ඉගැන්විය යුතුය.

(iii) එක් එක් ළමයා පිළිබඳව පුද්ගලික අවධානය යොමු කිරීමට හැකිවන පරිදි උපදේශක වැඩසටහන් සංවිධානය කළ යුතුය.

(iv) ගොඩනැගිලි ඇතුළු පරිශ්‍රය නිසි අයුරින් නඩත්තු කර පිරිසිදු කර පවත්වා ගෙන යා යුතුය.

(v) නිවාස සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතුය.

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 3.2. අධ්‍යාපනය

### 3.2.1. පාසල් අධ්‍යාපනය

මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

(අ) 2011 නොවැම්බර් 03 දින සිට 2011 නොවැම්බර් 16 දින දක්වා සිදු කරන ලද නියැදි පරීක්ෂාව මගින් අනාවරනය වූ පරිදි රන්මුතුගල සහතික කළ පාසලේ දිනපතා වැඩ වෙන්කිරීමේ ලේඛනයට අනුව ළමුන්ගෙන් සියයට 50 ක් පාසල් නොයන බව හෝ වෘත්තීය අධ්‍යාපනය හදාරනු නොලබන බව නිරීක්ෂණය විය. ඔවුන්ගෙන් සමහරෙක් මුළුතැන්ගෙයි වැඩවල යෙදී සිටි අතර අනිත් ළමුන් රූපවාහිනිය නරඹමින් හෝ නිෂ්කාර්යව සිටි බව දක්නා ලදී.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හා උසස් පෙළ ප්‍රතිඵල ලේඛන හා වාර්තා පොත් හා වැඩ පොත් පරීක්ෂාකාරීව බැලීමේ දී ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන එකක් හැර අන් සියළුම ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සියළුම ළමුන් පාසේ ආහාර, අමතර පාසල් පොත්, නිල ඇඳුම්, පාසැල් බෑග් ආදී ප්‍රමාණවත් පහසුකම් ලබා දී තිබුණද අධ්‍යාපන මට්ටම සතුටුදායක නොවීය.

(ඇ) රන්මුතුගල සහතික කළ පාසල හා මාකොළ සහතික පාසල්වල සාක්ෂරතා ඒකකයන්හි පොත් හා වාර්තා පරීක්ෂාකාරීව බැලීමේ දී ක්‍රමවත්ව හා නියමිත වේලාවට ළමුන්ගේ පැමිණීම සිදු නොවන බව අනාවරණය විය. තවද දිවා ආහාර හා තේ විවේකය ලබාදුන් පසු බොහෝ ළමුන් නියමිත වේලාවට ආපසු නොපැමිණෙන බවත්, ඇතැම් බොහෝ දෙනෙක් කිසිසේත්ම ආපසු නොපැමිණෙන බවත් අපට නිරීක්ෂණය විය.

(ඈ) පානදුර ප්‍රදේශයේ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක සහ නුගේගොඩ ප්‍රදේශයේ බාලිකා ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක අකුරු නොදත් ළමුන් දෙදෙනෙක් විය. නමුත් එම ළමුන්ට අකුරු හැකියාව ලබාදීමට කිසිදු වැඩ පිළිවෙලක් නොවීය.

(ඉ) 2011 නොවැම්බර් 17 දින සහ 2011 දෙසැම්බර් 14 දින විගණන දිනයන්හි සිදු කරන ලද විගණනයන් අනුව රන්මුතුගල සහතික කළ පාසලේ සහ මාකොළ සහතික කළ පාසලේ සාක්ෂරතා ඒකකවල පිළිවෙලින් ළමුන් 16 ක් හා 9 ක් විය. මෙම ළමුන්ගේ වයස හා දැනුම් මට්ටම එකිනෙකට වෙනස් උවද එම ළමුන් සඳහා පුද්ගලික අවධානය යොමුකර නොතිබුණි.

(ඊ) මෙම සහතික කළ පාසල් වල එක් ගුරුවරියක් සමාජ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා ධාරිණියක් වූ අතර අනික් ගුරුවරයා උපාධිධාරියෙක් විය. මෙම ක්ෂේත්‍රය පිළිබඳ ඔවුන්ට ප්‍රමාණවත් පහසුකම් තිබුණද අකුරු හැකියාව නොමැති සහ හැකියාව අවම ළමුන්ට ඉගැන්වීම සඳහා ඔවුන් පුහුණුකර නොතිබුණි.

(උ) අකුරු හැකියාව නොමැති ළමුන්ට ඉගැන්වීම සඳහා පුහුණුව නොලැබූ ගුරුවරුන් විසින් සාක්ෂරතා පන්තිවල විෂය නිර්දේශයන්හි අඩංගු කරුණු හා විෂය කරුණු සකස්කර තිබුණි.

(ඌ) මාකොල සහ රන්මුතුගල සහතික කල පාසල් වල ළමුන් පිළිවෙලින් 12 දෙනෙකු හා 21 ක් දෙනෙකු ද, ස්වෙච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 04 ක ළමුන් 19 දෙනෙකු ද ඔවුන්ගේ වයස් ප්‍රමාණයට අනුව අධ්‍යාපන මට්ටමට ළගා වී නොසිටි බැවින් පාසල් වෙත යොමුකර නොතිබුණි.

**ඇගවීම**

(i) ආයතනයෙන් ළමුන් සමාජගත වීමේදි රැකියා ඉඩ ප්‍රස්ථා ලබා ගැනිමේ දුෂ්කරතාවයක් ඇති වීම.

(ii) සාක්ෂරතාවය අඩු ළමා පරපුරක් බිහිවීම.

(iii) ඉහත තත්ත්වය අනාගතයේ දී රජයට අමතර වැය බරක් ඇති කිරීම.

(iv) පිරිහුණු මානසිකත්වයකින් යුතු ළමුන් සමාජගත වීම.

(v) ළමුන් සමාජගත විමේදී සාමාන්‍ය ළමුන් සමග මුහු වීමට අපහසු වීම.

(vi) යහපත් පුරවැසියන් බිහි කිරීමේ පරමාර්ථ ඉටු නොවීම.

(vii) රජය විසින් මෙම ආයතන නඩත්තු කිරීම සඳහා වෙන්කරන ලද අරමුදල් වලින් ප්‍රමාණවත් ප්‍රථි ලාභයක් නොලැබීම.

**නිර්දේශ**

(i) රජයේ නිවාස හා ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල පාසල් යන ළමුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා විධිමත් අධ්‍යාපනික වැඩසටහන් හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතුය.

(ii) මාකොළ සහතික කළ පාසලේ හා රන්මුතුගල සහතික කළ පාසලේ පාසල් යන ළමුන්ගේ නවාතැන් ස්ථාන, බාධාවක් නොමැතිව ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතු පහසු කිරීමට හැකිවන පරිදි අනෙක් ළමුන්ගෙන් වෙන්කළ යුතුය.

(iii) රජය සහ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ළමුන්ගේ අධ්‍යාපනයේ සාර්ථකත්වය වෙනුවෙන් අධ්‍යාපනය සඳහා වූ පහසුකම්වලට අමතරව ළමුන් පිළිබඳව ක්‍රමවත් හා නිසි අධීක්ෂණයක් ලබාදිය යුතුය.

(iv) මාකොළ හා රන්මුතුගල සහතික කළ පාසල් වල ගුරුවරුන් සඳහා විධිමත් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

(v) ළමුන් රජයේ පාසල් වලට ඇතුල් කිරීම සඳහා කොමසාරිස් වරයා හා පරිවාස නිලධාරීන් එකතුව කටයුතු කළ යුතුය.

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

**3.2.2 වෘත්තීය අධ්‍යාපනය**

**වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධයෙන් අදාල පාසල් වල සිදු කළ පරීක්ෂණ වලදී පහත කරුණු අනාවරනය විය.**

(අ) **මාකොළ සහතික කළ පාසැල**

පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සහතික කළ පාසල්වල ළමුන් සඳහා සැලසුම් කරන ලද වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳ පරීක්ෂාවේදී ලෝහවැඩ, මැහුම්, විදුලි, ලී වැඩ, කෘෂිකර්ම, පරිගණක, පෙදරේරු වැනි විෂයයන් අදාල පාඨමාලාවන් යටතේ හැදෑරීමට අවස්ථාව සලසා දී තිබුණි.

ගුරුවරුන් බඳවා නොගැනීම හේතුවෙන් පැස්සුම්, ලෝහ වැඩ, පින්තාරු වැඩ, ලියවන පට්ටල් යන පාඨමාලා දැනට පවත්වනු නොලබන බව නිරීක්ෂණය විය. මෙම පාසැලේ පෙදරේරු පාඨමාලාව පිළිබඳව පහත නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(i) පෙදරේරු පාඨමාලාව පැවැත්වීම සඳහා මාකොළ සහතික කළ පාසැලට ගුරුවරුන් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණද පාඨමාලාව නිසි පරිදි පවත්වාගෙන යනු ලබන්නේ එක් ගුරුවරයෙකු විසින් පමණි.

(ii) පෙදරේරු අංශයේ ළමුන්ගේ දුර්වල පැමිණීම හේතුකොටගෙන පාඨමාලාව නිසි අයුරින් පවත්වාගෙන යාමට අදාල ගුරුවරයාට නොහැකිව පැවතුණි.

(iii) මෙම පාසැලේ පෙදරේරු අංශයේ සහ විදුලි අංශයේ වහලයෙන් වැසි ජලය කාන්දුවන බැවින් පාඨමාලා පැවැත්වීමට මූලික පහසුකම් නොමැති තත්ත්වයක් පැවතුණි.



මාකොළ සහතික කළ පාසලේ පෙදරේරු අංශයේ කැඩුණු වහලය



මාකොළ සහතික කළ පාසලේ අපිළිවෙළට දර්ශනය වූ පෙදරේරු අංශය

මෙම පාසලේ විදුලි අංශයේ සම්පත් පරීක්ෂා කිරීමේ දී පහත කරුණු අනාවරණය විය.

ගුරුවරයාගේ හා ළමුන්ගේ ක්‍රියාශ්‍රිලි සහභාගීත්වය සහිතව මෙම සහතික පාසලේ විදුලි අංශය පවත්වාගෙන යමින් තිබුණද, පාඨමාලා සඳහා අවශ්‍ය ගුණාත්මක බවින් යුතු ද්‍රව්‍ය නියමිත වේලාවට ලබාදී නොතිබූ අතර මෙහි වහලයෙන් ද වර්ෂා කාලයේ දී වැසි ජලය කාන්දුවන බව නිරීක්ෂණය විය.



මාකොළ සහතික කළ පාසලේ විදුලි අංශය

**(ආ) රන්මුතුගල සහතික කළ පාසල**

විස්තර පහත පරිදි විය.

(i) රන්මුතුගල සහතික කළ පාසලේ ආහාර පිසීමේ පාඨමාලාව සඳහා අවශ්‍ය වූ ඇතැම් අත්‍යවශ්‍ය උපකරණ ප්‍රමාණවත් පරිදි නොමැති වුවද, ගුරුවරයාගේ හා ළමුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය නිසා එම පාඨමාලාව පවත්වා ගෙන ගොස් තිබුණි.

(ii) උදය වරුව හා සවස් වරුව වශයෙන් පන්ති සැසි දෙකකට ළමුන් අන්තර් ග්‍රහනය කර තිබුණි. වෙනත් පුහුණුවීම් පාඨමාලා කිහිපයක් සඳහා සමහර ළමුන් එම වේලාවටම කණ්ඩායම් කර තිබූ අතර විධිමත් පරිදි ළමුන් මේ සඳහා යොමුකර නොතිබූ නිසා සහ විධිමත් අධීක්‍ෂණයක් නොමැති වීම හේතුවෙන් ළමුන්ගේ සහභාගීත්වය දුර්වල විය. ළමුන් නිසි පරිදි අන්තර් ග්‍රහනය කර ක්‍රමවත්ව පාඨමාලා වලට සහභාගී වීමට ඔවුන් යොමු කළේ නම් මෙම පාඨමාලා වලින් ඉහල නිසි දැනුමක් ලබාගත හැකිව තිබුණි.

(iii) රජයේ මධ්‍යස්ථානවල ආයතනගත කර ඇති, පාසල් අධ්‍යාපනය නොලබන සිසුන් සඳහා වෘත්තීමය අධ්‍යාපනය හා පුහුණුව සපයනු ලැබේ. රන්මුතුගල සහතික කළ පාසලේ පවත්වන වෘත්තීමය අධ්‍යාපන වැඩසටහන්, නිසි පරිදි සැලසුම්කර නොතිබුණි. උදාහරණ ලෙස ජුකී මැහුම් හා කෘෂිකර්ම පාඨමාලා පූර්ණ කාලීනව දිනපතා පවත්වනු ලැබේ. පූර්ණ කාලීන පාඨමාලා සඳහා තෝරාගත් ළමුන් රූපලාවණ්‍ය ශිල්පය, පරිගණක පාඨමාලා ආදී වෙනත් අර්ධ කාලීන පාඨමාලා සඳහා ද තෝරා ගෙන තිබුණි. එම හේතුව නිසා රන්මුතුගල සහතික පාසලේ කිසිදු ළමයෙකු විසින් පූර්ණ කාලීන පාඨමාලා හා අර්ධ කාලීන පාඨමාලා නිසි පරිදි සම්පූර්ණ කර නොතිබූ අතර මේ හේතුව නිසා, පාඨමාලා සම්පූර්ණ වූ පසු ප්‍රදානය කරන සහතික පත්‍ර ලබාදීමට නොහැකිවී තිබුණි.

(iv) රන්මුතුගල සහතික කළ පාසලේ ජුකී, කොණ්ඩා මෝස්තර, රූපලාවන්‍ය ශිල්පය සහ ගෘහ විද්‍යා යන උපදේශකවරුන් විසින් ඉල්ලීම් කර තිබුණු පාඨමාලා පැවැත්වීම සඳහා අවශ්‍යවන යෙදවුම් බාධාවකින් තොරව පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සැපයිය යුතු වුවද 2011 නොවැම්බර් 17 විගණන දිනය දක්වා ඒවා සපයා නොතිබුණි.

රන්මුතුගල සහතික පාසැලේ කෘෂිකර්ම අංශය සම්බන්ධයෙන් පහත නිරීක්‍ෂණයන් කරනු ලැබේ.

(i) එහි උපදේශකවරයාට අනුව විෂය නිර්දේශය ඉතා පුළුල් වී ඇති අතර එය ළමුන්ගේ දැනුම් මට්ටම ඉක්මවා නිර්මාණය කර ඇති හෙයින් සාර්ථකව එය පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) එක් එක් ළමුන්ගේ වයස හා මානසික මට්ටමට ගැලපෙන පරිදි විෂය නිර්දේශ වෙනස් කර තිබුණි. පරීක්ෂණ දිනය වූ 2011 නොවැම්බර් 17 දින මෙම ආයතනයට පැමිණෙන විට එහි ළමුන් වත්ත පිරිසිදු කරමින් හා පොල් පැළ සිටුවීමට වළවල් හාරමින් සිටින ලදී. සිටවනු

ලැබූ ඇතැම් පොල් පැල කිහිපයකට හානි වී තිබූ නමුත් 2011 නොවැම්බර් 17 විගණන දිනය වන විට ඒ සඳහා අතිරේක පොල්පැල ලබා ගැනීමට තිබුණද හානි වූ පොල් පැල වෙනුවට ඒවා යොදාගෙන නොතිබුණි. තවද වර්ෂ 05 කට වැඩි කාලයක් පොහොර සපයා නොතිබූ හෙයින් ළමුන්ගේ එම ව්‍යායාමය සාර්ථක වී නොතිබුණි.

(iii) වර්ෂ 13 ක කාලයක් උපදේශකවරියන් මෙහි සේවයේ යෙදී සිටියද ගෙවත්ත අලංකරණය, බෝග වගාව ඇතුළු මූලික කටයුතු සතුටුදායක ලෙස ඉටු කර නොතිබුණි.

(iv) කෘෂිකාර්මික කුටියක් ඉදිකිරීමට හා ඉනිමගක් සැපයීමට රු.58,592 ක් වටිනා අමුද්‍රව්‍ය ලබාදී තිබුණද මිලදී ගන්නා ලද අමුද්‍රව්‍ය අදාල කාරණය සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රියව පැවතුණි. එසේම එම මිලදීගත් ද්‍රව්‍ය අදාල කාර්යය සඳහා සුදුසු ඒවා නොවීය.

**(ඇ) ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන**

නාරාහේන්පිට ප්‍රදේශයේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් විසින් අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) විභාගයන්ට පෙනී සිටි ප්‍රතිඵල අපේක්ෂිත සිසුවියන් සඳහා ඉවුම් පිහුම් සහ මැහුම් යන පාඨමාලාවන් සාර්ථක ලෙස පවත්වා තිබුණි.මෙය මෙම මධ්‍යස්ථානය මගින් ළමුන්ගේ යහපත වෙනුවෙන් ගන්නා ලද ප්‍රශංසනාත්මක උත්සහයකි.

නුගේගොඩ ප්‍රදේශයේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානය මඟින් පාසැල් යන හා පාසල් නොයන ගැහැණු ළමුන් සඳහා මැහුම් ගෙතුම් පාඨමාලාවන් පවත්වා තිබුණි. ළමා සංවර්ධන මධ්‍යස්ථානයට අමතරව මෙම ආයතනය ස්වේච්ඡා පුහුණු ආයතනයක් ලෙස ලියාපදිංචි වී තිබුණද මෙම ආයතනය විසින් පවත්වනු ලබන මැහුම් හා චිත්‍ර කලා පාඨමාලා පහත සඳහන් හේතූන් මත නිසි පරිදි සංවිධානය කර හෝ පාලනයකර නොතිබුණි.

(i) ළමුන්ගේ පැමිණීම දුර්වල වීම. (ළමුන් පරිශ්‍රයේ නිකරුනේ ගැවසෙමින් සිටිනු දක්නට ලැබුණි.)

(ii) පාඨමාලා සඳහා අමු ද්‍රව්‍ය හිගකම (නූල්, රෙදි ආදිය)

(iii) නිසි අධීක්ෂණය නොමැති වීම.

(iv) පාඨමාලාව සඳහා විෂයමාලාවක් නොමැතිවීම.

(v) සාර්ථකව පාඨමාලාව සම්පූර්ණ කළ ළමුන් සඳහා සහතික නිකුත් කිරීමක් සිදු නොකිරීම.

(vi) ළමුන් විසින් අත්කරගත් කාර්ය සාධන ඇගයීම සඳහා විධිමත් කළමනාකරණ හා ඇගයීම් ක්‍රමයක් පාඨමාලා සඳහා නොමැති වීම.

**ඇඟවීම**

(i) වෘත්තීය පුහුණු පාඨමාලාවල ප්‍රායෝගික පුහුණුවීම් හා අනෙකුත් අවශ්‍යතා සඳහා අවශ්‍යවන ද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදය හේතුවෙන් පුහුණු කටයුතු සාර්ථකව පවත්වාගෙන යාමට නොහැකිවීම.

(ii) පුහුණු වැඩසටහන් සම්පාදනය කිරීමේ අවිධිමත් බව නිසා වැඩසටහන් වලින් අපේක්ෂිත අරමුණු ඉටුනොවීම.

(iii) විධිමත් සැලැස්මක් නොමැතිවීම හා අකාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් ළමුන්හට පාඨමාලාවක් ඵලදායක ලෙස නිමකිරීමට නොහැකිවීම.

(iv) කෘෂිකර්ම කුටියේ අවශ්‍යතාවය හා එහිදී අත්කරගන්නා ප්‍රතිලාභ කලින් තක්සේරුකර නොතිබුණු හෙයින් ඒ සඳහා දරන ලද වියදම නිෂ්ඵල බවට පත් වී තිබීම.

(v) පාසැල් නොගිය ළමුන් ඔවුන්ගේ වයසට අනුව නියමිත කියවීමේ හා ලිවීමේ හැකියාව ලබාගෙන නොමැතිවීම් හේතුවෙන් පාසලේ නියමිත ශ්‍රේණියට ඇතුලත් කිරීමට බාධාවක් වීම.

**නිර්දේශ**

(i) විදුහල්පති විසින් සෑම ළමයෙකුටම වෘත්තීය පුහුණුවක යෙදිය හැකි ආකාරයෙන් පාඨමාලා සැලසුම්කර කාල සටහන් පිළියෙල කළ යුතු වීම.

(ii) අවිධිමත් අධ්‍යාපනය සඳහා මධ්‍යස්ථානය විසින් ළමුන්ට සැපයිය යුතු අවශ්‍ය සියළු සම්පත් ප්‍රමාදයකින් තොරව නියමිත වේලාවට සැපයිය යුතු වීම.

(iii) වැඩ සටහන් සහ ව්‍යාපෘතීන් සඳහා ද්‍රව්‍ය ලබා ගැනීමේ දී ඒ පිළිබඳ දැනුම ඇති නිලධාරියෙකු විසින් එහි අවශ්‍යතාවය තක්සේරු කිරීමෙන් පසු ඒවායේ ගුණාත්මක තත්ත්වය, ප්‍රමාණය සහ වර්ගය තීරණය කිරීමෙන් පසු මිල දී ගැනීම කළ යුතු ය. මිලදී ගැනීම්, ප්‍රසම්පාදන පටිපාටි අනුව සිදු විය යුතු වේ.

(iv) උදේ සහ සවස් වරුව සඳහා දිනකට සැසි දෙකක් සැලසුම් කර ඒ සඳහා ළමුන් සුදුසු පරිදි වෙන් කළ යුතු වීම.

(v) ළමුන්ගේ පැමිණීම තහවුරු කර ගැනීම සඳහා විධිමත් අධීක්ෂණයක් පවත්වා ගැනීම.

(vi) සියළුම පාඨමාලා සඳහා විධිමත් ඇගයීම් ක්‍රමයක් හඳුන්වා දිය යුතු අතර පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කළ ළමුන් සඳහා සහතික නිකුත් කිරීම.

(vii) මාකොළ සහතික කල පාසලේ පෙදරේරු හා විදුලි අංශවල නඩත්තු කටයුතු අප්‍රමාදව සිදුකිරීම තුලින් ඔවුන්ට ආරක්ෂාකාරීව පුහුණු කටයුතු සිදුකිරීමට අවස්ථාව සලසාදීම.

(viii) දෛනික ඉගැන්වීම් කටයුතු වාර්තා කිරීමට ගුරුවරුන්ට වාර්තා කිරීමේ ක්‍රමයක් හඳුන්වාදිම.

(ix) ස්වාධීනව තම ජීවිත පවත්වා ගැනීමට හැකිවන පරිදි වෘත්තීමය පුහුණු කටයුතුවල යෙදවීමේ අවස්ථාවන් සෑම ළමයෙකුටම ලබාදිය යුතු අතර එය සමාජයට යහපත් පුරවැසියන් බිහිකිරීමේ කාර්යක් සේ සැලකීම.

(x) ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල අධ්‍යාපනය විධිමත් කළ යුතුය. නේවාසික කාල පරිච්ඡේදය තුළ දී විධිමත් හා අවිධිමත් අධ්‍යාපනයක් ලබා දෙන්නේ නම් ළමුන්ට ඔවුන්ගේ අධ්‍යාපනය වැඩි දියුණු කර ගැනීමට හැකිවනු ඇත.

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 3.3 රැකවරණය හා ආරක්ෂාව

මේ සම්බන්ධයෙන් පහත සදහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පහත දැක්වෙන ගැටළුකාරි තත්ත්වයන්ට හේතුවන රජයේ සහතික පාසැල්වල ,රැඳවුම් නිවාසවල හා ස්වේච්ඡා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින ළමුන් සම්බන්ධයෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මධ්‍යගත දත්ත පදනම් පද්ධතියක් නොමැතිවීම හේතුවෙන් පහත දැක්වෙන ගැටලුකාරී තත්ත්වයන් පැනනැගීමට හේතුවී තිබුණි.

(i) අවශ්‍යතාවයක් පැන නැගුන විට ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල ළමුන්ගේ නේවාසික ස්ථානයන් විධිමත්ව හඳුනාගැනීමට තොරතුරු නොමැතිවීම.

(ii) පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව භාරයේ ආරක්ෂාව හා අධීක්‍ෂණය යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින ළමුන්ගේ සංඛ්‍යාව තහවුරුකර ගැනීමට නොහැකියාව.

(iii) රන්මුතුගල සහ මාකොළ සහතික කළ පාසල් වල ඇතුළත් කිරිම් හා පිටත් කිරිම් ලේඛන සහ පැමිණීමේ ලේඛන පිළිබඳව පරීක්‍ෂා කිරීමේ දී බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ළමුන් උසාවිවලට ඉදිරිපත් කිරීමට රැගෙනයාම සම්බන්ධයෙන් 2011 වර්ෂයේ රන්මුතුගල සහතික කළ පාසලේ ළමුන් 06 දෙනෙකු පිළිබඳවද 2010 වර්ෂයේ මාකොළ සහතික කළ පාසලේ ළමුන් 10 දෙනෙකු පිළිබඳවද කිසිදු සටහනක් හෝ වාර්තාවක් පවත්වා නොතිබුණි. බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව අතර නිසි සන්නිවේදන ක්‍රමයක් නොමැති වීම හේතුවෙන් මෙය සිදු වී තිබුණි.

(iv) වයස මාස 01 සිට අවුරුදු 5 තරමේ වු ළමයින්ට ආරක්‍ෂාව සලසන ලියාපදිංචි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලින් ළමුන් ඇතුලත් කිරිම් හා පිට කිරිම් ලේඛනය පරීක්‍ෂා කිරීමේ දී 2009, 2010 හා 2011 වර්ෂයන් තුළ අදාල නිවාසයෙන් මාරු කරන ලද ළමුන් 7 දෙනෙකු පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු නොතිබුණු බව අනාවරණය විය.

**(ආ)** ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට පැමිණෙන ළමුන්ගෙන් වැඩි දෙනෙක් , දෙමවුපියන්ගෙන් කෙනෙකු විදේශගතව සිටින, සිරගතව සිටින හෝ දෙවැනි විවාහයක් කරගත් හෝ දෙමව්පියන් වෙන් වූ දුගී පවුල් වලින් ආරක්ෂාව සඳහා පැමිණෙන ළමුන් විය. එම ළමා සංවර්ධන මධ්‍යස්ථානවලට අපයෝජිත ළමුන් ද යොමු කරනු ලැබේ. මෙම වර්ග දෙකේ ළමුන් විවිධ පසුබිම් වලට අයත් වන අතර අපයෝජිත ළමුන් විසින් ඔවුන්ගේ අවාසනාවන්ත අත්දැකීම් එම වයස් කාණ්ඩවල ළමුන් සමග හුවමාරුකර ගැනීමට අවස්ථාව ලැබී තිබුණි. වයස අවුරුදු 18 දී වැඩිහිටි වියට පත්වීමට පෙර විරුද්ධ ලිංගකයන් සමඟ අයථා සම්බන්ධකම් පවත්වා ගැනීමෙන් බාලක වරදකරුවන් බවට ළමුන් පත්වී ඇත. අපයෝජිත හා අත්හැර දැමූ ළමුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නම** | **ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ සිටි ළමුන් සංඛ්‍යාව** | **අසරණ වූ ළමුන් සංඛ්‍යාව** | |
|---|---|---|---|
| | | **අපයෝජිත** | **අත්හැර දැමූ** |
| නාරාහේන්පිට පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් | 34 | 01 | 33 |
| කැළණියේ පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් | 24 | 01 | 23 |
| මහරගම පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් | 72 | 02 | 70 |
| පානදුර පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් | 28 | 03 | 25 |
| කළුතර පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් | 48 | 07 | 41 |
| නුගේගොඩ පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් | 150 | 07 | 143 |

(ඇ) නිසි ආරක්ෂක ක්‍රමවේදයක් නොමැතිවීම හේතුවෙන් 2009, 2010 හා 2011 යන වර්ෂවල මාකොළ රැදවුම් නිවාසය, මාකොළ හා රන්මුතුගල සහතික කළ පාසැල් වලට යොමු කරන ලද බාලක වරදකරුවන්ගෙන් පිළිවෙලින් 43, 41, හා 58 ක් පැනගොස් තිබුණි. පසුව ඔවුන් දෙමාපියන්ගේ /ඥාතීන්ගේ නිවාස වලින් හමුවූ බවත් නිරීක්ෂණය විය.

(ඇ) පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුව, වයස අවුරුදු 02 අඩු ළමුන් 05 දෙනෙකු සඳහා හා වයස අවුරුදු 02 – 06 අතර ළමුන් 5 දෙනෙකු සඳහා සහ වයස අවුරුදු 06 ට වැඩි ළමුන් 25 ක් සඳහා එක් නිවාස මාතාවක් හා ඕවර්සියර්වරයෙකු සිටිය යුතුය. එක් එක් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල නේවාසිකව සිටි ළමුන් සංඛ්‍යාව සැසඳීමේ දී, නිරීක්‍ෂණය වූ පරිදි සෑම රජයේ හා ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයකම සේවා මුර චක්‍රයට ප්‍රමාණවත් පරිදි නිවාස මව්වරුන් / පරීක්‍ෂකවරුන් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීය.

(ඉ) දෙමාපියන් හෝ භාරකරුවන් විධිමත්ව හඳුනාගැනීමෙන් තොරව ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ළමුන් පිටතට යැවීමට අවසර ලබාදීමේ ලිපි පරිවාස නිලධාරීන් විසින් ලබා දී තිබුණි.

(ඊ) රන්මුතුගල හා මාකොළ රැඳවුම් නිවාසය, මාකොළ හා රන්මුතුගල සහතික කළ පාසල් සහ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ළමුන් සඳහා වූ ආරක්‍ෂණ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් භෞතික පරික්‍ෂණයන් සිදුකරන අවස්ථාවලදී අනාවරණය වූ තත්වය පහත පරිදි විය.

(i) **රන්මුතුගල රැඳවුම් නිවාසය**

මෙම නිවාසයේ විදුලි පද්ධතිය හා ගොඩනැගිලි වල ඇතැම් ස්ථාන ඉතා අනාරක්ෂිත ඒවා බව නිරීක්ෂණය විය.



රන්මුතුගල රැඳවුම් නිවාසයේ අනාරක්ෂිත විදුලි පද්ධතිය.



රන්මුතුගල රැඳවුම් නිවාසයේ කෘමියන්ගෙන් අනාරක්ෂිත වූ ආහාර ගබඩාව.

## (ii) රන්මුතුගල සහතික කළ පාසල

පහත කරුණු නිරීක්ෂණය විය.

- රන්මුතුගල සහතික කළ පාසලේ ළමුන් සංඛ්‍යාව 50කට වැඩියෙන් සිටියද මුරකරු නොපැමිණීම නිසා එක් නිවාස මව් කෙනෙකු සමග පමණක් ළමුන්ට වැඩිකාලයක් ගත කිරීමට සිදුවී තිබුණි.
- පොළව මට්ටමේ සිට අඩි 50 ක් පමණ උස වූ ජල ටැංකිය තබා තිබූ තට්ටුවට ගැහැණු ළමුන් දෙදෙනකු නැග තිබුණි.
- ඉවත් කරන ලද කැඩුණු ඇඳන්,පුටු හා අල්මාරි තොගයක් රන්මුතුගල සහතික කළ පාසැලේ පැරණි ගොඩනැගිල්ලේ අවට ගොඩ ගසා තිබුණු අතර ඉන් හානිකර සතුන් බෝවීමේ අවදානමක් පැවතුණි.



රන්මුතුගල රැදවුම් නිවාසයේ කැඩුණු ලී බඩු



රන්මුතුගල රැදවුම් නිවාසයේ කැඩුණු ලී බඩු

## (iii) මාකොළ සහතික කළ පාසල

පහත කරුණු නිරීක්ෂණය විය.

2011 නොවැම්බර් 02 විගණිත දින පිරිමි ළමයෙකු විසින් කුස්සියේ විදුලි පේණුව නොමැති සහ විදුලි වයරය අග ආවරණය කර නොමැතිව විශාල බොයිලේරුවක තේ සඳහා වතුර උණු කරමින් සිටිනු අප විසින් නිරීක්ෂණය කරන ලදි.




මාකොළ සහතික කළ පාසලේ

අනාරක්ෂිත විදුලි පද්ධතිය



මාකොල සහතික කළ පාසලේ ආවරණය

නොකෙරුණු වැසිකිළි වළ

**(iv) ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන**

පහත කරුණු නිරීක්ෂණය විය.

- අවුරුදු 6 - 17 දක්වා වයසේ වූ ළමුන් 40ක් නඩත්තු කරන පානදුර ප්‍රදේශයේ එක් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයක වත්තේ අනාරක්ෂිත ළිදක් පිහිටා තිබුණි.
- සෙල්ලම් කරන අවස්ථාවේ දී පිරිමි ළමුන් ළිදට බැස තම ඇඳුම් සෝදා ගන්නා බව එම නිවාසයේ මේට්‍රන්වරිය විසින් ප්‍රකාශ කරන ලදී. ළිද තරමක් ගැඹුරු වූ අතර ඉන් අනතුරු සිදුවීමේ හැකියාවන් පැවතිණි. ළමුන් පාලනය කර ගැනීම දුෂ්කර වී තිබුණි.
- එම ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පරණ කොහු මෙට්ට ගොඩ ගසා තිබූ අතර ඒවා ක්‍රමවත්ව බැහැර නොකළහොත් ගිනි ගැනීමේ අවදානමක් පැවතුණි.
- පැපිලියාන හා මොරටුව යන ප්‍රදේශ වල පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථාන දෙකක් හැර, අනෙකුත් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල විගණනය සිදුකරන අවස්ථාවේ දී ගැහැණු ළමුන් 40 කට වැඩියෙන් නේවාසිකව සිටි නමුත් ආරක්ෂක නිලධාරීන් සේවයේ යොදවා නොතිබුණි.
- ළමා සංවර්ධන මධ්‍යස්ථාන දෙකක හැර අනික් සියළුම ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරිශ්‍රවල ළමුන්ගේ අරක්ෂාව සඳහා ගිනි ආරක්ෂණ උපකරණ සවිකර තිබුණි.

(උ) බස්නාහිර පළාතේ පිහිටි ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 24 ක් විගණනය දිනය වූ 2011 නොවැම්බර් 02 දිනය දක්වා බස්නාහිර පළාත් 2008 අංක 01 දරන ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කර නොතිබුණි.

(ඌ) ඉහත ළමා සංවර්ධන මධ්‍යස්ථාන අතුරින් සමහර මධ්‍යස්ථාන වර්ෂ 10 කට වැඩි කාලයක් සිට ක්‍රියාත්මකවන ඒවා වේ. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොන්දේසි ඉටුකර නොමැති බැවින් මෙම ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබුණි. කෙසේ වුවද පසුගිය වර්ෂ ගණනාවක් තුළ මෙම ළමා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ක්‍රමවත් අධීක්ෂණයක් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය. වැල්ලවත්ත ප්‍රදේශයේ ලියාපදිංචි නොකළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක් පිළිබඳ සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී පසුගිය වර්ෂ තුනක කාලයක් පරිවාස නිලධාරියා එම ස්ථානයට පැමිණ නොමැති බවද නිරීක්ෂණය විය. මාධ්‍ය තොරතුරු වලට අනුව මෙවැනි ලියාපදිංචි නොකළ ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ළමුන්ට අකාරුණිකව සැලකීම හා කළමණාකාරීත්වය විසින් ළමුන් විවිධ දුරාචාරවලට යෙදවීම් පිළිබඳ බොහෝ අවස්ථාවන් වාර්තා කර තිබුණි. එවැනි අවස්ථා දෙකක් පහත දැක්වේ.

(i) ගම්පහ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි නොකළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයක පිරිමි ළමයෙකු ගින්නක් හේතුවෙන් මරණයට පත්වීම.

(ii) ජා ඇල ප්‍රදේශයේ අදාල ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ පූජකවරයෙකු විසින් ගැහැණු ළමුන් දෙදෙනෙකු අපයෝජනය කිරීම.

**ඇඟවීම**

(i) උසාවි වලින් යොමුකරන ලද ළමුන් බොහෝ දෙනෙක් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුවෙන් විධිමත් අධීක්ෂණයක් නොමැතිව රැඳවුම් නිවාසවල රඳවා තිබුණි. දවසේ පැය 24 පුරාම සේවයේ යෙදවීම සඳහා ප්‍රමාණවත් ආරක්ෂක නිලධාරීන් සංඛ්‍යාවක් මෙවැනි නිවාසවල නොසිටීමෙන් පෙනී යන්නේ ඔවුන්ගේ පාලනය යටතේ ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීමට නොහැකි බවයි.

(ii) ළමුන්ට අවශ්‍යවන ආරක්ෂාව, රැකවරණය හා අධ්‍යාපනය ඔවුන්ගේ වයස් ප්‍රමාණයන්ට අනුව සපයනු නොලැබෙන අතර එය මානසික පසුබෑමට හා අයහපත් පුරුදු වලට යොමු වීමට හේතු වේ.

(iii) අත්හැරදැමු හා අසරණ වූ හා බොහෝ ළමුන් අපයෝජිත වූ ළමුන් සමඟ එම ළමා සංවර්ධන මධ්‍යස්ථානයේම එකට වාසය කෙරේ. නිවාස භාරකරුවන් පැහැදිලි කළ පරිදි , ප්‍රමාණවත්

කාර්ය මණ්ඩලයක් නොමැතිවීමෙන් නිසි අධීක්ෂණයක් නොමැති වීම හේතුකොට ගෙන අනිසි ලිංගික ක්‍රියාකාරකම්වලට මෙහි පසුබිම සැකසී තිබීම.

(iv) ළමා සංවර්ධන මධ්‍යස්ථාන / පාසල් වල ක්‍රමවත් ඵලදායී අධීක්ෂණයක් තහවුරුකර ගැනීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම හේතුකොටගෙන උසාවි වලින් යොමු කෙරෙන වරදකරුවන් වූ ගැහැණු ළමුන් නිසි අධීක්ෂණයක් යටතේ රඳවා නොතිබීම.

(v) අවසරලත් ලිපි නිකුත් කිරීමට පෙර විධිමත් හඳුනාගැනීමේ පරීක්ෂාවක් පරිවාස නිලධාරින් මඟින් නොකෙරෙන හෙයින් උසාවි මඟින් යොමු කෙරෙන ළමුන් මුදාහැරීමේ ගැටළුවලට නිවාස භාරකරුවන්ට මුහුණ දීමට සිදුවේ.

(vi) දිනකට පැය 24 පුරාම ළමුන් බලාගත යුතුවන බැවින් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම නිසා සේවා මුර පදනම මත වැඩ කරන සේවකයන්ට ළමුන් බලා ගැනීම අපහසු වී ඇත. වයස අවුරුදු එකට අඩු ළදරුවන් තබා තිබෙන ප්‍රජාපති ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ මෙම තත්ත්වය බරපතල විය. ළමයෙකු රෝගී වූ විට හෝ රෝහල් ගත කළ විට එක් නිවාස මාතාවක් විසින් එම ළදරුවා රැක බලා ගත යුතු විය. මෙම තත්ත්වය යටතේ එම දිනයේම සමහර දරුවන් සායනවලට ගෙන යා යුතු විය.ඒ නිසා මෙම මධ්‍යස්ථානයෙන් එම ළදරුවන්ට අවශ්‍ය නිසි ආරක්ෂාව, ආදරය හා කරුණාව නොලැබීම.

(vii) පුරප්පාඩු පිරවීම සඳහා බලධාරින් ගෙන ඇති ක්‍රියාමාර්ග දුර්වල මට්ටමක පැවතීම.

(viii) ගේට්ටු මුර කිරීම සඳහා මාකොළ හා රන්මුතුගල සහතික කළ පාසල්වල ගැහැණු ළමුන් ඇතුළුව ළමුන් යොදවා තිබීම අවදානම් සහිත වීම.

**නිර්දේශ**

(i) කිසිදු බාධාවක් නොමැතිව රාජකාරි සිදුකරගෙන යාම සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව සියළුම ආයතන සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගත යුතුය.

(ii) ආරක්ෂාව හා රැකවරණය අවශ්‍ය ළමුන් රැඳවුම් නිවාසවල රැඳවීමෙන් තොරව ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට යොමු කිරීමටත් වැරදිකරුවන් නොවන ළමුන් පිළිබඳව උසාවි වලට කරුණු දැන්වීමටත් පරිවාස නිළධාරින් යොමු කරවීම ක්‍රමවත් කිරීම.

(iii) අපයෝජිත ළමුන් වෙනත් ළමුන්ගෙන් වෙන්කර තැබිය යුතු අතර වෙනම ළමා සංවර්ධන මධ්‍යස්ථානයක රැඳවිය යුතුය.

(iv) සහතික කළ පාසල් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීම හා ඵලදායී රාජකාරි වැඩසටහන් හඳුන්වා දීම.

(v) කිසියම් ළමයෙකු ළමා සංවර්ධන මධ්‍යස්ථානයකින් පිටතට ගෙනයාමට අනුමැතිය ලබාගන්නා පුද්ගලයින් පිළිබඳව පරිවාස නිලධාරින් විසින් අවසරපත් නිකුත් කිරීමට පෙර ඊට අදාල වාර්තා පවත්වා ගත යුතුය. අවසරලත් ලිපියේ පුද්ගලයාගේ, නම හැඳුනුම්පත් අංකය හා ලිපිනය ද දුරකථන අංක ආදී තොරතුරු ඇතුළත් කළ යුතුය.

(vi) රන්මුතුගල සහතික කළ පැසලේ ජල ටැංකියට පිවිසිය හැකි ඉණිමග තිබෙන ප්‍රදේශය ළමුන්ට යා නොහැකි පරිදි ආවරණය කළ යුතුය.

(vii) රජයේ නිවාස හා ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ගේට්ටු රාජකාරි සඳහා ළමුන් යොදවා නොගත යුතුය.

(viii) මධ්‍යස්ථානයේ ස්වභාවය අනුව ආරක්ෂක නිලධාරින් බඳවා ගැනීමට ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට අවශ්‍ය උපදෙස් ලබා දීම. ( පිරිමි ළමා නිවාස සඳහා පිරිමි ආරක්ෂක නිලධාරියෙකු හා ගැහැණු ළමා නිවාස සඳහා කාන්තා ආරක්ෂක නිලධාරිණියක වශයෙන්)

(ix) අනාරක්ෂිත ළිං, අනාවෘත විදුලි කම්බි වැනි අනතුරුදායී ස්ථාන නිසි අයුරින් ආවරණය/ අලුත්වැඩියා කිරීම.

(x) සියළුම ආයතනවල ගිනි නිවීමේ උපකරණ සවිකිරීමට අනිවාර්ය කළ යුතුය.

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 3.4 ගුණාත්මක ප්‍රමිතීන්

ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලද අවම ගුණාත්මක ප්‍රමිතීන් ක්‍රියාත්මක නොකෙරේ. නිරීක්ෂණයන් පහත පරිදි වේ.

(අ) රන්මුතුගල හා මාකොළ රැඳවුම් නිවාසවල මුළුතැන්ගෙය හා ප්‍රජාපති ළමුන් භාරගැනීමේ නිවාසයේ මුළුතැන්ගෙය විගණන දිනයේ දී පිරිසිදු තත්ත්වයෙන් තිබුණු නමුත්, රන්මුතුගල හා මාකොළ සහතික කළ පැසල්වල මුළුතැන්ගෙවල් ඉතා අපිරිසිදු තත්ත්වයෙන් පැවතුණි. (අපිරිසිදු හා ආහාර කොටස් බිම තැන තැන විසිරී තිබුණු අතර මැස්සන්ද බහුල විය.) කාණු පද්ධතිය අපිරිසිදු වී ගොඩනැගිලි වල ජනෙල් කැඩී තිබුණි.



මාකොළ සහතික කළ පාසලේ අපිරිසිදු මුළුතැන්ගෙය



මාකොළ සහතික කළ පාසලේ අපිරිසිදු මුළුතැන්ගෙය



රන්මුතුගල සහතික කළ පාසලේ අපිරිසිදු මුළුතැන්ගෙය



රන්මුතුගල සහතික කළ පාසලේ අපිරිසිදු මුළුතැන්ගෙය

(ආ) රන්මුතුගල සහතික කළ පාසැලේ බොහෝ ළමුන් හැදසිටි වස්ත්‍ර ඉතා කිලුටු ඒවා විය.

(ඇ) තට්ටු 3ක ගොඩනැගිල්ලේ දෙවැනි මහල නිසි පරිදි භාවිතා නොකිරීම හේතුවෙන් දුර්ගන්ධයක් පිටවෙමින් තිබුණු අතර වැසිකිලි වලවල් උතුරා ගොස් තිබුණි.

**ඇගවීම**

(i) පිරිසිදුව සිටීම පිළිබඳ ළමුන්ගේ හැඟීම ඉතා පහළ මට්ටමක විය.

(ii) අපිරිසිදු වැසිකිළි පැවතීම හේතුවෙන් ළමුන් ලෙඩ වීමේ හැකියාවක් තිබුණි.

(iii) ලියාපදිංචි නොකළ ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ළමා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය ප්‍රමාණවත් නොවීම.

**නිර්දේශ**

(i) මුළුතැන්ගෙය පිළිබඳ පිරිසිදු භාවය සෑම අවස්ථාවකදීම පවත්වා ගැනීමට මාකොළ හා රන්මුතුගල සහතික පාසල් වලට අනුයුක්ත කාර්යමණ්ඩලයට උපදෙස් දීම.

(ii) මානසික හා කායික ආබාධ සහිත ළමුන් සමාජ සේවා දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සුදුසු ආයතනවලට මාරු කිරීම.

(iii) ප්‍රදේශවල තිබෙන සියළුම ලියාපදිංචි හා ලියාපදිංචි නොකළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරිවාස නිලධාරින් විසින් ක්‍රමවත් පරිදි පරීක්ෂාකර අධීක්ෂණය කළ යුතුවීම.

(iv) ලියාපදිංචි නොකළ සියළුම මධ්‍යස්ථාන සඳහා ලියාපදිංචිය සඳහා අවශ්‍යතා සම්පූර්ණ කිරීමට නිශ්චිත කාල පර්ච්ඡේදයක් ලබාදීම.

(v) සාමාජීය වශයෙන් වැදගත්වන පුද්ගලයන් හෝ ළමා ආරකෂක කටයුතු පිළිබඳ අවබෝධයක් තිබෙන පුද්ගලයන් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල කළමණාකාරීත්වයට ඇතුළත් විය යුතුය.

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

**3.5 සමාජගත කිරිම.**

ළමා සංවර්ධන මධ්‍යස්ථානයක ළමුන් රඳවා තැබිය හැකි උපරිම කාලය වර්ෂ 2 ක් හෝ 3 ක් වේ. මෙම කාලච්ඡේදය තුළදී ළමුන් ඔවුන්ගේ දෙමාපියන්ට, නැදැයින්ට ආදී වශයෙන් භාරදී ඔවුන් සමාජගත කිරීමට පරිවාස නිලධාරීන් විසින් කටයුතු කළ යුතුය. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණයන් පහත පරිදි විය.

(අ) නිලධාරීන් මෙම අවශ්‍යතාවයට අනුකූල වීම සඳහා හෝ පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයාගේ අනුමැතිය සහිතව ළමුන් රඳවාගැනීමේ කාලසීමාව දිර්ඝ කිරීමට කටයුතු කලයුතු වුව ද කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) පහත දැක්වෙන හේතුන් මත සමහර ළමුන් දරුකමට හදාවඩා ගැනීමට දී නොතිබීම හෝ එම ක්‍රියාවලියේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

(i) පරිවාස නිලධාරීන්ගේ වාර්තා නිකුත් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් විගණිත දිනය වූ 2011 සැප්තැම්බර් 28 දිනට මාස 4 සිට වර්ෂ 12 කාලයක් ආයතන ගතව සිටි ළමුන් 22 ක් සිටි අතර දරුකමට හදාවඩා ගැනීමටදීමේ ක්‍රියාවලියේ ප්‍රමාදයන් තිබුණි. ඒ සඳහා පහත කරුණු හේතු වී තිබුණි.

- ළමුන්ගේ වාර්තා ප්‍රමාදය (දෙමාපිය විස්තර – නාමමාත්‍ර)
- පරිවාස නිලධාරීන්ගේ වාර්තා ප්‍රමාදය හේතුවෙන් දෙමාපියන් ලියාපදිංචි කිරිමේ ප්‍රමාදය (ලියාපදිංචියට පෙර පරිවාස නිලධාරියා විසින් ඔවුන්ගේ පසුබිම පිලිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.)

(ii) පරිවාස නිලධාරීන්ගේ වාර්තා ප්‍රමාදය හේතුවෙන් විගණිත දිනය වූ 2011 නොවැම්බර් 15 දිනට ළමුන් හදාවඩා ගැනීමට කැමැත්තෙන් සිටි දෙමාපියන් 51 දෙනෙකුට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වීමට නොහැකි වී තිබුණි.

(iii) අඩු වයසැති මවුවරුන්ට තීරණ ගැනීමට නොහැකි වීම.

විගණිත දිනය වූ 2011 සැප්තැම්බර් 26 දිනට මව්වරුන් අඩු වයස් සීමාවේ සිටීම හේතුවෙන් හදාවඩා ගැනීමට නොදුන් ළදරුවන් (මව්වරුන්ගේ වයස අවුරුදු 15ට අඩුවිය) 6 දෙනෙකු හමු විය.

(ඈ) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ පුනරුත්ථාපන ක්‍රියාවලිය මඟින් ළමා, තරුණ හා වැඩිහිටි වරදකරුවන් සමාජගත කිරීමයි. අප විසින් තැපැල් මඟින් ළමා සංවර්ධන මධ්‍යස්ථාන 42 ක දත්ත රැස්කරගත් අතර ඒ පිළිබඳ නිරීක්ෂණ පහත පරිදි විය.

(i) අදාල මධ්‍යස්ථානවල ළමුන් සමාජ ගත කිරීම සම්බන්ධයෙන් ගෙන තිබූ ක්‍රියාමාර්ග 05 ක් විය. ඊට අදාල තොරතුරු පහත පරිදි විය.

| සමාජගත කිරීමේ ක්‍රමය | සමාජ ගත කළ සංඛ්‍යාව - වර්ෂය | | |
|---|---|---|---|
| | **2009** | **2010** | **2011** |
| දෙමව්පියන්ට හෝ නෑදෑයින්ට භාරදුන් ළමුන් සංඛ්‍යාව | 133 | 181 | 154 |
| රැකියාවන්ට යොමුකරන ලද ළමුන් සංඛ්‍යාව | 27 | 23 | 18 |
| විවාහ කර වූ ළමුන් සංඛ්‍යාව | 01 | 03 | 06 |
| හදාවඩා ගැනීම අවසන් කළ ළමුන් සංඛ්‍යාව | 08 | 13 | 24 |
| කැපකරු දෙමව්පියන්ට යොමුකළ ළමුන් සංඛ්‍යාව | 03 | 14 | 03 |

(ii) ළමයෙකු ආයතනයට ඇතුළත් කළ වහාම ළමයාගේ පවුල් පසුබිම පිළිබඳව වාර්තාවක් පරිවාස නිලධාරියා විසින් ඉදිරිපත් කළ යුතුය. රන්මුතුගල සහතික පාසැලේ ළමුන් 4 දෙනෙකු හා මාකොළ සහතික පාසැලේ ළමුන් 15 දෙනෙකු සම්බන්ධයෙන් ඔවුන් ආයතනගත කර දිගු කාලයක් ගත වී තිබුණද එම වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. මෙය මෙම ළමුන් සමාජ ගතකිරීම පිළිබඳව හා ඔවුන් වෙනුවෙන් ගතයුතු සුභසාධන ක්‍රියාමාර්ග ගැනීම සඳහා වූ ප්‍රධාන බාධක වලින් එකක් විය.

(ඇ) 2008 අංක 01 දරන බස්නාහිර පළාතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රඥප්තියට අනුව, මාසයකට එක් ස්ථාපිත කමිටු රැස්වීමක් පැවැත්විය යුතුය. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ ප්‍රතිඵල පහත පරිදි වේ.

(i) **රජයේ නිවාස**

ස්ථාපිත කමිටු රැස්වීම් පැවැත්විම ප්‍රගතිය පරීක්ෂා කිරීමේ දී ප්‍රජාපති ළමුන් භාර මධ්‍යස්ථානයේ 2009, 2010 හා 2011 යන වර්ෂවල පිළිවෙලින් කමිටු රැස්වීම් 10ක් 01ක් හා 03ක් පමණක් පවත්වා තිබුණු අතර රන්මුතුගල සහතික කළ පාසලේ 2010 හා 2011 යන වර්ෂ වල පිළිවෙලින් කමිටු රැස්වීම් 03ක් හා 04ක් පමණක් පවත්වා තිබුණ අතර මෙම රැස්වීම් පැවැත් වීම සතුටුදායක මට්ටමක නොවීය.

(ii) **ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන**

ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 09 ක වර්ෂ තුනක පැවතිය යුතු අවම රැස්වීම් වාර ගණන පවත්වා නොතිබුණ අතර තවත් ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන 04ක අදාල රැස්වීම් කිසිසේත්ම පවත්වා නොතිබුණි.

(ඉ) එක් එක් ළමයා පිළිබඳ පරිවාස වාර්තා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල නොතිබු බැවින් ළමයින්ට අවශ්‍ය නියමයන් ද ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරු නොතිබුණි.

| ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ නම | ළමුන් සංඛ්‍යාව | පරිවාස වාර්තා නොමැති ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| නාරාහේන්පිට ළමා සංවර්ධන මධ්‍යස්ථානය | 48 | 17 |
| පානදුර ළමා සංවර්ධන මධ්‍යස්ථානය | 13 | 04 |
| මාකොළ සහතික කල පාසල | 74 | 16 |
| බොරැල්ල ළමා සංවර්ධන මධ්‍යස්ථානය | 38 | 06 |
| නුගේගොඩ ළමා සංවර්ධන මධ්‍යස්ථානය | 108 | 21 |

(ඊ) උප්පැන්න සහතික නොමැතිවීමෙන් හෝ අනුමාන වයස් සහතික, උපන් වේලාව, උප්පැන්න සහතිකයේ පියාගේ නම ආදිය නොමැති වීම හේතුකොට ගෙන හදා වඩා ගැනීමට දීමකින් තොරව ප්‍රජාපති ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ ළදරුවන් දීර්ඝ කාලයක් රඳවා තිබුණි.

**ඇගවීම**

(i) යහපත් පුරවැසියන් ලෙස අපේක්ෂිත ළමුන් සංඛ්‍යාවක් සමාජ ගතකිරීමට නොහැකි වීම.

(ii) සමාජගත කිරීම පිළබඳ වගකිය යුතු නිලධාරීන්ගේ අකාර්යක්‍ෂමභාවය හේතුවෙන් දෙමාපියන්/නැදෑයින් සමඟ ජීවත් වීමට කැමති ළමුන් ඒ සඳහා යොමු නොකර ළමා සංවර්ධන මධ්‍යස්ථානවල රඳවා ගැනීමෙන් ළමුන්ට එම අවස්ථා අහිමි වී තිබුණි. මෙම හේතුව නිසා ළමුන් කෲරත්වයට පත්වීම හා අනෙකුත් ළමුන් හා ගැටුම් ඇතිකර ගැනීම සඳහා යොමු වීමක් පැවතුණි.

(iii) නියමිත පරිදි පාසල් නොගොස් ළමුන් වයසින් වැඩුණු පසු බොහෝ විට රැකියා අවස්ථා සලසා ගැනීම දුෂ්කර වී තිබුණි. වයසින් වැඩි ළමුන් හදාවඩා ගැනීමට දීම අපහසු වී ඇත. කැපකරු මාපියන්ට ළදරු වයසේ දී ලබාගත් ළදරුවන් තමන්ගේ දරුවන් ලෙස හදාවඩා ගැනීමේ හැකියාවක් පැවතීම.

(iv) උසාවි වල කටයුතු, ග්‍රාම නිලධාරි හමුවීම, ප්‍රාදේශිය ලේකම් හමුවීම හා පාසල්වලට ළමුන් ඇතුලත් කිරීම හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් හෝ පාසැල් ප්‍රධානාචාර්යවරුන් මුණ ගැසීම වැනි විශාල වැඩ ප්‍රමාණයක් පැවරී තිබීම හේතුවෙන් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල පාලිකාවන්ට ඒවා හොඳින් පරිපාලනය කිරීම දුෂ්කර වී ඇත.

(v) රජයේ නිලධාරීන්ගේ අධීක්‍ෂණය නොමැති ලියාපදිංචි නොකළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල ළමුන් පිළිබඳ විමර්ශන වාර්තා ඉදිරිපත් කිරීමේ දී පරිවාස නිලධාරීන්ගේ රාජකාරී වල අඩුපාඩු නිසා ළමුන්ට අනර්ථදායක වු විවිධ ගැටළු රාශියකට මුහුණ පෑමට සිදුවී ඇත.

(vi) ළමුන් දරුකමට හදාවඩා ගැනීමේ ක්‍රියාවලියේ පරිපාටි විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

**නිර්දේශ**

(i) ළදරු අවධියේ දී ම ළමුන් දරුකමට හදාවඩා ගැනීමට භාරදීම සඳහා පිළිගත හැකි නව පරිපාටි හඳුන්වා දිය යුතුය.

(ii) ළමයෙකුගේ අනාගතය පිළිබඳව වගකීම දරන පුද්ගලයන් වන්නේ දෙමාපියන් වන බැවින් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින ළමුන්ගේ දෙමාපියන් සඳහා ළමුන්ගේ වටිනාකම, ආදරය, ආරක්ෂාව හා අවධානය මෙන්ම යහපත් පුරවැසියන් වීම සඳහා රැකවරණය හා මඟ පෙන්වීම වැනි සංකල්ප හඳුන්වා දීමට දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කළ යුතු වීම.

(iii) මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ, උපදෙස් දැඩිව අනුගමනය කිරීම සඳහා පරිවාස නිලධාරීන්ට උපදෙස් ලබාදිය යුතු වීම.

(iv) ළදරුවකු නිවාසයටකට භාරදීමේදි උප්පැන්න සහතිකය/අනුමාන වයස් සහතික හා වෙනත් තොරතුරු මවගෙන් හෝ වෛද්‍ය නිලධාරියාගෙන් ලබාගැනීමට අදාල නිලධාරීන් විසින් විශේෂ අවධානයක් යොමු කළ යුතුවීම.

(v) ළමා සංවර්ධන මධ්‍යස්ථානවල භාරකරු හා වෙනත් කාර්ය මණ්ඩලය විසින් උපරිම මට්ටමෙන් ආදරය හා ආරක්ෂාව සහිතව ළමුන් රැක බලාගැනීම කළ යුතුවීම.

(vi) සියළුම ලියාපදිංචි නොකළ ළමා සංවර්ධන මධ්‍යස්ථාන අදාල ව්‍යවස්ථා යටතේ ලියාපදිංචි කළ යුතු අතර ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සියළුම ළමුන් අදාල නිලධාරීන්ගේ අධීක්ෂණයට ලක් කිරීම.

(vii) ළමුන් පිළිබඳ වාර්තා කලට වේලාවලට නිකුත් කිරීමට පරිවාස නිලධාරීන්ට උපදෙස් දීම.

(viii) මධ්‍යස්ථානවලට භාරගන්නා අඩුවයස් මව්වරුන් හා ඔවුන්ගේ ළමුන් පිළිබඳව දැනට නීතිමය විධිවිධාන නොමැත. මේ සම්බන්ධයෙන් විශේෂ ක්‍රියාමාර්ග ගත යුතු වුවාක් මෙන්ම මෙම ක්ෂේත්‍රය ආවරණය වීමට පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ඉක්මන් පියවර ගත යුතුය.

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 3.6 තත් කාර්ය සහනාධාර හා නඩත්තු ගාස්තු

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ලියාපදිංචි කළ ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින සියළුම නේවාසික ළමුන් සඳහා දිනකට රු.20 ක් නඩත්තු සඳහා ආධාර මුදලක් පරිවාස හා ළමාරක්‍ෂක දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ලැබේ. බොහෝ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට ලැබෙන ආධාර අදාල වර්ෂය තුලදීම ලැබීම වෙනුවට සමහර මාස සඳහා ප්‍රමාද වී ලැබී තිබුණු බව නිරීක්‍ෂණය විය. ළමුන්ගේ සුභසාධන පහසුකම් ශක්තිමත් කිරීම උදෙසා මෙම ක්‍රියාවලිය වේගවත් කිරීමට දෙපාර්තමේන්තුව කිසිදු පියවරක් ගෙන නොතිබුණි. විස්තර පහත පරිදි වේ.

| ප්‍රමාද කාලය | ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | ගෙවන ලද මුදල |
|---|---|---|
| (2009 වර්ෂය) | | රු. |
| මාස 2 – 5 | 37 | 7,956,860 |
| මාස 6 - 9 | 19 | 3,831,206 |

(ආ) මුල් බිල්පත් නිරවුල් නොකිරීම නිසා 2006 වර්ෂයෙන් පසු තත්කාර්ය සහනාධාර ළමා සංවර්ධන මධ්‍යස්ථාන වලට ගෙවා නොතිබුණි.එම මධ්‍යස්ථාන 04 ක් සඳහා ඒවායේ ඉල්ලීම පරිදි එම මුදල් වලින් 90% ක ප්‍රමාණයක් පමණක් ගෙවා තිබූ අතර මෙය විගණිත දිනය වූ 2011 අගෝස්තු 31 දිනවන විට ගෙවා තිබූ අවසාන ගෙවීම වූ බවද නිරීක්ෂණය විය.තවද ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම සඳහා වාර්ෂිකව ලබාදෙනු ලබන මුදල් ප්‍රතිපාදන ද නියමිත දිනට ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පෙබරවාරි 15 ට පෙර පරිවාස නිලධාරීන්ගේ හා නිවාස භාර පරිවාස නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ තත්කාර්ය ආධාර සැපයීමට පරිපාටි අනුගමනය කළ යුතු බවට නිරීක්ෂණය වුවද, ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රමාදයන් පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ප්‍රමාද කාලය | ළමා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | ගෙවන ලද මුදල |
|---|---|---|
| ------------------- | ------------ | -------------- |
| (2009 වර්ෂය) | | රු. |
| මාස 5 | 06 | 776,605 |
| මාස 6 – 7 දක්වා | 32 | 3,307,207 |

**ඇඟවීම**

(i) ළමා සංවර්ධන මධ්‍යස්ථානවල හා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ දුර්වලතාවයන් හේතුවෙන් සමහර ළමා සංවර්ධන මධ්‍යස්ථාන මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දෙනු ලැබේ.

(ii) නිර්දේශ වාර්තා ඉදිරිපත් කිරිමේ ප්‍රමාදය හේතුවෙන් ගොඩනැගිලි නඩත්තුවට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන නිසි පරිදි නොලැබීම නිසා මෙම ගොඩනැගිලි වලට දිගු කළක සිට තීන්ත ආලේප කර නොතිබුණි. ආයතන ගත ළමුන්ගේ සෞඛ්‍ය තත්ත්වයට හා මධ්‍යස්ථානයේ සුන්දරත්වය නැති වීමට මෙය බලපා තිබුණි.

(iii) සෑම වර්ෂයකදීම ගොඩනැගිලි නඩත්තු වැඩ සිදු කර නොතිබුණි. එම තත්ත්වය ළමුන්ගේ මානසික කායික සෞඛ්‍යට බලපෑම් ඇති කරයි.

**නිර්දේශ**

(i) ළමා සංවර්ධන මධ්‍යස්ථානවල කළමනාකරුවන් විසින් අදාල ආකෘති නියමිත වේලාවට සම්පූර්ණ කළ යුතුය. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2009 පෙබරවාරි 01 දිනැති අංක 01/2009 දරන චක්‍රලේඛයේ 4.7 හා 5.4 ඡේද ප්‍රකාරව නිවාසය භාරව සිටින පරිවාස නිලධාරියා විසින් ඊළඟ වර්ෂයේ ජනවාරි 31 ට පෙර එම ආකෘතියේ එක් පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

(ii) නිවාසය භාරව සිටින පරිවාස නිලධාරියා විසින් 2009 පෙබරවාරි 01 දිනැති අංක 02/2009 දරන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු චක්‍ර ලේඛයේ 13.3 ඡේදය අනුගමනය කර මිලදී ගත් භාණ්ඩ සඳහා බිල්පත්‍ර පරිවාස නිලධාරියාගේ නිර්දේශය සහිතව කොමසාරිස්වරයාට ඉදිරිපත් කළ යුතුය.

(iv) දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛයට අනුකූලව කොමසාරිස්වරයා හා අනිකුත් කාර්ය මණ්ඩලය විසින් තත්කාර්ය ආධාර නියමිත අවස්ථාවන්හි ගෙවීමට පියවර ගත යුතුය.

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

**3.7 සේවක මණ්ඩල පරිපාලනය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සේවය කරන නිවාස භාරකරුවන්ට ප්‍රමාණවත් සුදුසුකම් හා එම කාර්යය සඳහා පුහුණුවක් ලබා දී නොතිබුණි. මෙම තත්ත්වයන් යටතේ ඔවුනට ඉතා අඩු වැටුපක් ගෙවන අතර ඔවුන්ව දිරිමත් කිරීම සඳහා උසස්වීම් / වැටුප් වර්ධක දීර්ඝ කාලයකින් ලැබී නොතිබුණි.

(ආ) රන්මුතුගල රැඳවුම් නිවාසයේ හා මාකොළ රැඳවුම් නිවාසයේ ළමුන්ගේ ලිපිගොනු පරීක්ෂා කිරිමේදී උසාවියෙන් රඳවා ගැනීමේ කාලය නියම නොකරන ලද ළමුන් (රඳවා ගැනිමේ

උපරිම කාලය සති දෙකකි) රන්මුතුගල රැඳවුම් නිවාසයේ 6 දෙනෙකු හා මාකොළ රැඳවුම් නිවාසයේ 3 දෙනෙකු වශයෙන් විගණන දිනයන් වූ 2011 නොවැම්බර් 04 සහ නොවැම්බර් 17 දිනයන්හිදී සිටි බව නිරීක්ෂණය විය.

(ඇ) වර්ෂය තුලදී අවම වශයෙන් එක් දිනකදී හෝ අදාළ ළමා සංවර්ධන මධ්‍යස්ථානයට පරිවාස නිලධාරියා නොපැමිණි බව නිරීක්ෂණය විය. ඒ අනුව ළමුන්ගේ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීමට නිවාස භාරකරු හා පරිවාස නිලධාරියා අතර සන්නිවේදනයක් නොවීය.

(ඈ) 2006 වර්ෂයේ දී කොට්ටාව රැඳවුම් නිවාසයේ ළමයෙකුට ලිංගික පීඩාවක් කළ බවට වරදකරු වූ පිරිමි සහකාර නිවාස භාරකරුවෙකුට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර විශ්‍රාම යාමට නියමිත දිනය එනම් 2008 අගොස්තු 03 දින විශ්‍රාම යාමට හැකිවන පරිදි ඔහුගේ සේවය දිර්ඝ කර තිබුණි.

(ඉ) රජයේ නිවාස පහක සිටි කාර්ය මණ්ඩලයෙන් බොහෝ දෙනෙකුගේ සුදුසුකම් පිළිබඳව අදාළ පාර්ශවයන්ගෙන් තහවුරු කරගෙන නොතිබුණි**.**

(ඊ) බොහෝ නිලධාරීන්ගේ රාජකාරි ලැයිස්තු අදාළ ලිපි ගොනුවේ නොතිබුණි**.**

(උ) රන්මුතුගල සහතික කළ පාසලේ සේවය කරන අතරතුර දී ළමයින් දෙදෙනෙකුට ලිංගික පීඩාවන් සිදුකිරීමේ වරදට රිමාන්ඩ් කරන ලද තාවකාලික නිවාස මාතාවක්, විනය ක්‍රියාමාර්ගයක් ගැනිමෙන් තොරව, නිවාස මතාවක් ලෙස උසස් කර තිබුණි.

(ඌ) 2002 වර්ෂයේ සිට විගණන දිනය වූ 2011 නොවැම්බර් 16 දක්වා විවිධ අවස්ථාවල පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරුවල ඇති වූ පුරප්පාඩු 71 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 2011 ජුලි සිට බලපැවැත්වෙන පරිදි 2010 දෙසැම්බර් 31 දිනැති අංක 28/2010 දරන චක්‍රලේඛය ප්‍රකාරව නිලධාරින් 07 කගේ අදාල වැටුල් සංශෝධනයන් සිදුකර නොතිබුණි.

(ඒ) ඉහත හේතු නිසා පහත දැක්වෙන තත්ත්වයන් පැන නැගී ඇති බව නිරීක්ෂණය විය.

(i) සේවකයන්ගේ අතෘප්තිමත්භාවය

(ii) සේවකයන් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරි වලින් බැහැරව වෙනත් කාර්යන්හි යෙදීම.

(iii) ළමුන්ට සම්පූර්ණ අවධානය යොමුකළ නොහැකි වීම.

(ඔ) කාර්ය මණ්ඩලය විසින් තම ඇගයීම් වාර්තාවලින් පුහුණුව සඳහා ඉල්ලීම් කර තිබුණද ළමුන් සමඟ එදිනෙදා කටයුතු ඵලදායීව සිදු කිරීමට හැකිවන පරිදි කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව හා මඟ පෙන්වීම් ලබා දී නොතිබුණි.

**ඇඟවීම**

(i) මධ්‍යස්ථානවල පුරප්පාඩු නියමිත වේලාවට පුරවා නොමැති බැවින් පවතින කාර්ය මණ්ඩලය කාර්ය බහුල වීම හේතුවෙන් ඔවුන්ගෙන් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ii) මධ්‍යස්ථානවලට ඇතුළත් කරන ලද ළමුන් ඇතුළත් කිරීමේ දී ලබාගතයුතු නාම මාත්‍ර තොරතුරු නොතිබූ නිසා ළමුන්ගේ ජීවිත පිළිබඳ තීරණ ගැනීමේ දී හා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරිම අපහසු වීම.

**නිර්දේශ**

(i) ළමා සංවර්ධන මධ්‍යස්ථානවල කාර්ය මණ්ඩලය සඳහා ක්‍රමවත් ළමා රක්‍ෂණ හා ගැටුම් කළමනාකරණය පිළිබඳ පුහුණු සැලසුම් කර ලබා දීම.

(ii) රැකවරණය හා ආදරය සහිතව ළමුන් පාලනය කිරීම පිළිබඳව පුහුණුවීම්, භාරකරුවන් හා නිවාස මවුවරුන්ට ලබා දීම.

(iii) ළමුන්ගේ පෞද්ගලික තොරතුරු යාවත්කාලීන කිරීම මඟින් දරුවන් සමාජ ගත කිරීමේ කාර්යය පහසු කිරීම.

(iv) පරිවාස නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන වැඩසටහන් කාර්යයන් කොමසාරිස්වරයා විසින් හෝ වගකිව යුතු නිලධාරියෙකු විසින් පරික්‍ෂා කළ යුතුවීම.

(v) පද්ධතිය හොඳින් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීම.

(vi) කාර්ය මණ්ඩලයේ තෘප්තිමත්භාවය පවත්වා ගැනීම සඳහා හා යහපත් සේවාවක් ලබාදීමට ඔවුන් පෙළඹවීම සඳහා ඔවුන්ට එරෙහිව බරපතල චෝදනා නොමැත්තේ නම් නියමිත දිනට වැටුප් වර්ධක ලබාදීමට හා වැටුප් සංශෝධන ලබාදීමට පියවර ගැනීම.

(vii) ළමුන්ට සිදුකරන ලිංගික හිරිහැරයෙන් පිළිබඳ චෝදනා සම්බන්ධව විනය ක්‍රියාමාර්ග පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ එම සේවකයන්ට එරෙහිව විනය කටයුතු විධිමත් කිරීම

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

### 3.8 ඉඩම් ගොඩනැගිලි හා උපකරණ

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රන්මුතුගල සහතික කළ පාසැලේ හා මාකොළ සහතික කළ පාසැලේ ගොඩනැගිලි ඉදිකිරීම් 5ක් සම්පූර්ණ කළ දිනයේ සිට විගණන දිනය දක්වාම කිසිසෙත්ම භාවිතා කර නොතිබු බව නිරීක්‍ෂණය විය.

| සහතික කළ පාසැලේ නම | විගණන දිනය | ගොඩනැගිල්ලේ නම | වර්ගඵලය | සම්පූර්ණ කළ දිනය | වටිනාකම |
|---|---|---|---|---|---|
| ------------- | ------------ | ----------------- | ----------- | ---------- | ---------- |
| | | | | | රු. |
| රන්මුතුගල සහතික කළ පාසැල | 2011.10.25 | අවිවාහක නිලනිවාස | - | සඳහන් නොවේ | 1,456,356 |
| රන්මුතුගල සහතික කළ පාසැල | 2011.10.25 | ගිලන් කාමරය | - | 2010.10.05 | 3,660,428 |

| | | | | | |
|---|---|---|---|---|---|
| මාකොළ සහතික කළ පාසැල | 2011.12.15 | මුල්ගුරු නිලනිවාසය | 40’ x 47’ | | |
| මාකොළ සහතික කළ පාසැල | 2011.12.15 | ගිලන් කාමරය | 70 ’ x 25’ | 2011.07.17 | 4,259,516 |
| රන්මුතුගල සහතික කළ පාසැල | 2011.10.25 | මුරකරු කාමරය | - | 2007.11.30 | 248,585 |



භාවිතා නොකළ මුරකරු කාමරය



භාවිතා නොකළ තනිකඩ නිල නිවාසය



භාවිතා නොකළ මුල්ගුරු නිල නිවාසය

(ආ) රන්මුතුගල සහතික කළ පාසැලේ තනිකඩ නිල නිවාසවල ජනෙල් පියන් කිසිවෙකු විසින් කඩා තිබුණු බවත් ගොඩනැගිල්ල අවට ප්‍රදේශය තණකොළ වැවී තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඇ) අසනීප ළමුන් බලා ගැනීම සඳහා වෙනම කාර්ය මණ්ඩලයක් නොවු බැවින් මාකොළ සහතික කළ පාසලේ ගිලන් කාමරය නිමකළ දින සිට භාවිතයට ගෙන නොතිබුණි.



භාවිතා නොකළ ගිලන් කාමරය

(ඇ) ගොඩනැගිලි වල වටිනාකම දැක්වීම සඳහා වෙනම වාර්තා නොතිබුණි. 2011 දෙසැම්බර් 9 දිනැති අංක ඒඑෆ්/පීඑෆ්/2011/පීඒ තොරතුරු, ලිපිය මඟින් ගොඩනැගිලි වල වටිනාකම පිළිබඳ තොරතුරු අප විසින් ඉල්ලා සිටියද ඊට පිළිතුරක් ලැබී නොතිබුණි.


(ඉ) මාකොළ සහතික කළ පාසැලේ මුල්ගුරු නිල නිවාසය එය නිම කළ දිනය සිට භාවිතා නොකර ගබඩාවක් ලෙස යොදාගෙන තිබුණි.



මුල්ගුරු නිල නිවාසයේ භාවිතා නොකළ ලී බඩු ගබඩා කර තිබීම.



මුල්ගුරු නිල නිවාසයේ භාවිතා නොකළ ලීබඩු ගබඩා කිරීම.



මුල්ගුරු නිල නිවාසයේ භාවිතා නොකළ අල්මාරි



මුල්ගුරු නිල නිවාසයේ භාවිතා නොකළ අල්මාරි

(ඊ) මාකොළ සහතික කළ පාසැලේ මුල්ගුරු නිල නිවාසයේ කාමර දෙකක කැඩුණු පරිගණක,කැඩුණු ඇඳන් හා රාක්ක ගබඩා කර තිබුණු අතර නිල නිවාසයේ ආලින්දයේ අලුත් වානේ අල්මාරි 3ක් භාවිතා කිරීමෙන් තොරව ගබඩා කර තිබුණි.

(උ) මුල්ගුරු නිල නිවාසය අවට ප්‍රදේශය තණකොළ වලින් වැසී තිබුණි.



මුල්ගුරු නිල නිවාසය අවට පිරිසිදු කර

නොතිබුණ ප්‍රදේශ



මුල්ගුරු නිල නිවාසය අවට පිරිසිදු කර

නොතිබුණ ප්‍රදේශ

(ඌ) රෝගී වූ ළමුන් රඳවන ගොඩනැගිල්ල පොළව මට්ටමට වඩා පහතින් නිමවා තිබූ අතර පඩි 25ක් පහළට බැසීමට සිදුවීම නිසා අසනීප ළමුන් එහාමෙහා ගෙනයාම හා ප්‍රවාහන පහසුකම් වලදීද අපහසුතාවට පත්වීම.



ගිලන් හලට යෑමට ඇති පියගැටපෙල

**ඇඟවීම**

(i) වත්කම් මිලදී ගැනීම සැලසුම් කිරීම,අත්පත්කර ගැනීම හා පවත්වාගැනීමේදී රජයේ අරමුදල් නාස්ති වී තිබීම.

(ii) අපේක්ෂිත පරිදි ළමුන්ට ලැබිය යුතු පහසුකම් නොලැබීම.

**නිර්දේශ**

(i) නිෂ්කාර්ය වත්කම් පාවිච්චිය සඳහා ක්‍රියාමාර්ග ගැනීම.

(ii) ගොඩනැගිලිවල අඩුපාඩු සම්පූර්ණ කිරීම.

(iii) වත්කම් අත්පත්කර ගැනීමේදී සුදුසු ස්ථාන හා සුදුසු වත්කම් තෝරා ගැනීම.

## 3.9 අනිකුත් ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ට්‍රි අයිතම උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රුදවුම් නිවාසවල වත්කම් හඳුනා ගැනීම සඳහා අංක කර නොතිබුණි.

(ආ) රන්මුතුගල සහතික කළ පාසැලේ මැහුම් අංශයට 2011 මාර්තු 04 දින ගබඩාවෙන් අළුත් මහන මැෂින් 5 ක් ලැබී තිබුණද , ඒවා සම්පූර්ණයෙන් දිරාපත් වී තිබුණි.

(ඇ) අළුත්වැඩියා කොට භාවිතයට ගතහැකි තත්ත්වයේ වූ මහන මැෂින් (DA 135932) හා (DA137254) විගණන දිනය වූ 2011 ඔක්තෝබර් 25 දින වන විටද අළුත්වැඩියා කොට භාවිතයට ගෙන නොතිබුණි.

(ඈ) මේසය අළුත්වැඩියා කිරීමෙන් පසු පාවිච්චි කළ හැකිව තිබූ සිග්සැග් මැෂිම (C604010156) අදාල කාරණ සඳහා පාවිච්චියට නොගෙන පසෙක දමා තිබුණි.

(ඉ) රන්මුතුගල සහතික කළ පාසැලට හා ප්‍රජාපති භාරගැනීමේ නිවාසයට 2011 මාර්තු මාසයේදී රාජ්‍ය නොවන සංවිධානයකින් පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු ජල පෙරණ (යුනියන් යුඩබ් 60299060603) විගණිත දිනය වූ 2011 ඔක්තෝම්බර් 28 වන විටද ළමුන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කර නොතිබුණි.

(ඊ) 2008 වර්ෂයේදී ප්‍රජාපති ළමුන් භාරගැනීමේ නිවාසය විසින් රු.108, 503 කට මිලදී ගත් ළදරු ඇඳන් 15ක් භාවිතා කිරීමෙන් තොරව පැවතුණි.

**ඇඟවීම**

(i) වත්කම් භාවිතයට නොගැනීම නිසා හානිවිය හැකි වීම.
(ii) වත්කම් වලින් ලබා ගත හැකි ප්‍රතිලාභ අහිමිවීම
(iii) රජයේ වියදම් ආර්ථික හා ඵලදායී නොවීම

**නිර්දේශ**

(i) ඉන්වෙන්ටරි භාණ්ඩ නියමිත ක්‍රමවේදයට අනුව සංකේත අංක යෙදිය යුතු අතර,තොග වාර්තා ලේඛන, ඉන්වෙන්ටරි ආදිය සමඟ පරීක්‍ෂා කිරීමට හැකිවන පරිදි ක්‍රමවත් ආකාරයකට ලේඛන ගත කළ යුතුය.

(ii) ළමුන්ගේ පානීය ජල අවශ්‍යතා සපුරා ගැනීම සම්බන්ධ විශේෂ අවධානයකින් යුතුව කටයුතු කිරීම.

(iii) තොග සමීක්ෂණ කටයුතු අනුගමනය කිරීම.

(iv) ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත්ව අනුගමනය කිරීම.

**නියෝජිතායතන ප්‍රතිචාර**

- දක්වා ඇති අඩුපාඩු ක්‍රමක්‍රමයෙන් නිවැරදි කර ගන්නා අතර අදාල ආයතන වල තත්ත්වය සහ ප්‍රමිතීන් ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 4. නිගමනය

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරන ලද දිවයින පුරා පිහිටි නිවාස 253ක අනාථ, අත්හැරදැමූ, අසරණ හා අපයෝජිත වයස අවුරුදු 18 ට අඩු ළමුන් නේවාසිකව සිටිති. ඒවා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන ස්වේච්ඡා නිවාස හා රජයේ නිවාස වේ. රජයේ නිවාසවල රඳවා සිටින ළමුන් උසාවි වලින් යොමු කරන ලද ළමුන් වේ. ආහාර, අධ්‍යාපනය හා වෙනත් පහසුකම් එම පුනරුත්ථාපන කිරීමේ කාළය තුළ සපයමින් රජය විසින් ඔවුන්ට රැකවරණය සපයයි.ළමුන් සඳහා ආහාර සැපයීම, නවාතැන් හා සෞඛ්‍ය පහසුකම් ලබාදීම සතුටුදායක මට්ටමක වූ බව නිරීක්ෂණය විය. නිවාසවල සිටින බොහෝ ළමුන්ට ප්‍රාථමික හා ද්විතියක අධ්‍යාපනය ලබාදෙනු ලැබේ. එසේ වුවද අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ ප්‍රතිඵලවල සාර්ථකත්වය ඉතා දුර්වල මට්ටමක විය. ළමුන්ගේ ප්‍රගතිය පාසලේදී නිරතුරු පරීක්ෂා කළ යුතු අතර ඔවුන් දුර්වල විෂයයන් සඳහා අතිරේක අධ්‍යාපනය ලබාදිය යුතුය. ඵලදායී නොවූ කාල සටහන්, සහභාගි වන අයගේ පැමිණීම සටහන් නොවීම,නියමිත වේලාවට අවශ්‍ය ද්‍රව්‍ය නොසැපයීම ආදිය හේතුවෙන් ඇතැම් සහතික කළ පාසැල් වල පවත්වන ලද වෘත්තීය පුහුණු කටයුතු සතුටුදායක මට්ටමක නොවීය. පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් විධිමත් අධීක්ෂණය යටතේ මෙම දුර්වලතා වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. නිවාස වලින් මුදා හැරිය පසු ප්‍රයෝජනවත් පුරවැසියන් හැටියට ජීවත් වීමට හැකිවන පරිදි ළමුන්ගේ සංවර්ධන ක්‍රියාමාර්ගයන් ඇති කළ යුතුය.

රජයේ හෝ ස්වේච්ඡා ළමා නිවාසවල ළමුන් සඳහා දෙනු ලබන රැකවරණය, අවශ්‍ය ආරක්ෂක ක්‍රියාමාර්ග සහ සෞඛ්‍ය පහසුකම් ලබා දීම දක්ෂ හා උද්යෝගී කාර්ය මණ්ඩලයක් නොමැතිවීම නිසා මගහැරී තිබුණි. උසාවි වලට ගොස් ආපසු රැගෙන එන ළමුන්ගේ අවශ්‍ය තොරතුරු නිවාස මවුවරුන්ට ලබා නොදෙන අතර අදාල නිළධාරීන් විසින් උසාවි වලට රැගෙන යන/රැගෙන එන සියළුම ළමුන් සඳහා රැකවරණය හා අවශ්‍ය තොරතුරු යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ.

තවද නිවාසවල සමහර වත්කම් එනම් ළමුන්ගේ උපරිම යහපත සාක්ෂාත් වන අයුරින් යොදා ගැනීම කළ යුතුය. මෙම සියළු කරුණු සැලකිල්ලට ගෙන පරිවාස නිළධාරීන් විසින් මෙම ළමුන් සමාජගත කිරීමේ ක්‍රියාවලියේදී ඉටුකරනු ලබන කාර්ය භාරයන් නිසි පරිදි ඉටු කිරීමට අවශ්‍ය මූල්‍ය හා අනෙකුත් ප්‍රතිපාදන ලබාදෙමින් ළමුන් සමාජගත කිරීමේ

ක්‍රියාවලිය විධිමත් හා අර්ථවත් කිරීමේ කටයුතු කළ යුතු අතර මූලික වශයෙන් රජයේ ලියාපදිංචි නොකර පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා ළමා සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමටත් ඒවා නිසි අධීක්ෂණයට ලක් කිරීමටත් කටයුතු කිරීම මගින් පරිවාසගතවන ළමුන්ට සිදුවන අකටයුතුකම් අවම කලහැකි අතර ළමුන් හොඳ පුරවැසියන් ලෙස සමාජගත කිරීමට එමගින් අවස්ථාව සැලසේ.